# බළන්ගොඩ නගර සභාව

## 2019-12-10 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2019.12.10**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 17. ගරු නාගරික මන්ත්‍රී | අකිල එල්ලාවල මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්. එච්. ඒ. කරුණාරත්න මිය

**01. පසුගිය සභාවේ සභා වාර්තාව හා විශේෂ මහ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

අද දින මහ සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගනිමින් 2019-12-10 වන දින මාසික මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කල ගරු සභාපතිතුමා, 2019-11-11 දින පැවති මහ සභාවේ හා 2019-11-26 දින පැවති විශේෂ මහ සභාවේ සභා වාර්තා සත්‍යය වාර්තා බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් 2019-11-11 දින පැවති මහ සභාවේ හා 2019-11-26 දිනැති විශේෂ මහ සභාවේ සභා වාර්තා සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මෙදින සභා වාර්තාව සඳහා සංශෝධන තිබේදැයි ගරු සභාපතිතුමන් විමසා සිටි අවස්ථාවේ දී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා 2019-11-26 දිනැති විශේෂ මහ සභාවේදී තමන් බළන්ගොඩ නගර සභාව සතු මෝටර් ග්‍රේඩරය පිළිබඳ විමසීමක් සිදු කළ නමුත් ඒ පිළිබඳව කිසිඳු සටහනක් නොමැති බව ද එය අයවැයට සම්බන්ධ නොවුන ද බලන්ගෙඩ නගර සභාව සතු ලක්ෂ ගණනක දේපලක් බැවින් තමන් සිදු කළේ විශාල චෝදනාවක් බව ද පවසන ලදී.

එමෙන්ම 2019-11-11 දිනැති මහ සභාවේ සංශෝධන කිසිවක් නොතිබුණි.

**ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව සභා වාර්තා සභා සම්මත විය.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

මෙදින මහ සභාව සඳහා නිවේදන කිසිවක් නොතිබුණි

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

- අංක 41, දොරවෙල, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි එම්.ජන්දිරිස් මහතා විසින් තම නිවස පිටුපස නායයාමක් සිදු වී ඇති අතර එම තත්ත්වය නිසා වැසිකිළි වල පිරී පවතින බැවින් එම වැසිකිළි වල හිස් කර දෙන මෙන් ඉල්ලා තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.
- 55/3, දොරවෙල, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි රිචඩ් ප්‍රැන්සිස් මහතා විසින් එම ස්ථානයේ සිමෙන්ති ගල් නිෂ්පාදනය කිරීමේ ස්වයං රැකියාවක් කරගෙන යන බවත්, තමාගේ නිවස ඉදිරිපිට දොරවෙල මුගුණමලේ මාර්ගයට ආසන්නව බළන්ගොඩ නගර සභාවට අයත් පර්චස් දෙකක පමණ ඉඩම් කොටසෙහි සිමෙන්ති ගල් නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ගබඩා කර ගෙන ඇති බවත්,

එම පර්චස් දෙකක පමණ ඉඩම් කොටස තම ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා බදු ගනණයෙන් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

- බළන්ගොඩ නගරයේ නාගරික සංවර්ධන අධිකාරිය මගින් ඉදිකර ඇති වාණිජ සංකීර්ණයේ රථ වාහන නැවතුම් ස්ථාන සඳහා ප්‍රවිශ්ඨ වන මාර්ගය අවහිර වන සේ මැයි මාර ගස් දෙකක් පිහිටා ඇති අතර, ගස් කිහිපයක මුල් පොළොව මට්ටමෙන් ඉහළට වර්ධනය වී ඇති නිසා වාහන ගාල් කිරීමට බාධාවක්ව පවතින බැවින් එම මැයි මාර ගස් දෙක ඉවත් කිරීමට සහ පොළොව මට්ටමින් ඉහළට එස වී ඇති ගස් වල මුල් පොළොව මට්ටම දක්වා ඉවත් කිරීමට කටයුතු කර දෙන මෙන් ද එම ඉවත් කරන ගස් වෙනුවට වාණිජ සංකීර්ණයට සුදුසු පරිදි ගස් රෝපණය කිරීමට කටයුතු සිදු කරන බව ද පවසා එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

මෙහීදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, මෙම ගස් පේළිය රැකගැනීම සඳහා වෙළෙඳ සංගමය විසින් මහත් වෙහෙසක් දැරූ අතර නාගරික සංවර්ධන අධිකාරිය විසින් රථගාල සඳහා තිබූ ඉඩ ප්‍රමාණයේ මල් ගස් වවා බැම්මක් ඉදිකර ඇති නිසා එම ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම හේතු කොටගෙන මෙම ගස් කපා ඉවත් කිරීමට සූදානම් වන බව පවසන ලදී. එමෙන්ම තමා මෙම ගස් කැපීම සඳහා විරුද්ධ වීමට ප්‍රධාන හේතුව වන්නේ ස්වාභාවික සම්පත් විනාශ කිරීම හා රජයේ ආයතන නීත්‍යානුකූලව සිදු කරන කටයුතු සඳහා නිරන්තරයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විරුද්ධ වන නිසා බව ද එසේ නොමැතිව බළන්ගොඩ නගරය දියුණු වීම සඳහා ඇති අකමැත්ත නිසා නොවන බව ද පවසන ලදී.

එහිදී නාගරික සංවර්ධන අධිකාරියේ නිළධාරීන් සහ සභාවේ ගරු මන්ත්‍රීවරුන් සමග සාකච්ඡාවක් පැවැත්වීම සුදුසු බව සභාවේ මතය විය.

- මහජන පොළ කඩ කාමර අංක 11 හිමි ඊ.ඒ.ඩී.ඉන්දික නිරෝෂණ යන අය මිය ගිය නිසා ඔහුගේ ඥාති සහෝදර ටී.ඒ.දීපාල් ගයාන් තෙලේනිස් ආරච්චි මහතාට එම කඩ කාමරය ලබා දෙන මෙන් මිය ගිය අයගේ බිරිඳ වන එමිකා රෝෂණී ද සිල්වා මහත්මිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.
- 14/320, කිරිඳිගල, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි අරුණ ශාන්ත මහතාගේ නිවස පිටුපස ඉවුර කඩා වැටී වැසිකිලිය යට වී ඇති බැවින් එම පස් ඉවත් කිරීමට නගර සභාවේ වාහනයක් ලබා දෙන ලෙස ඉල්ලා තිබූ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

**04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම.**

මෙදිනට නියමිත ටෙන්ඩර් පත් විවෘත කිරීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

ටෙන්ඩර්පත් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කර ගන්නා ලදී.

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද පහත සඳහන් තීරණ සියල්ල ගරු සභාපතිතුමන් විසින් නැවත වරක් සභාවට ඉදිරිපත් කරන ලදී.

**04:01 2020 වර්ෂය සඳහා පොදු වෙලෙඳසැල අංක 16 දරණ එළ හරක් මස් කඩ කාමරය හා අංක 17 දරණ කුකුල් මස් කඩ කාමරය සඳහා ලංසුපත් විවෘත කිරීම**

- 2020 වර්ෂය සඳහා පොදු වෙළෙඳසැල අංක 16 දරණ එළ හරක් මස්කඩ කාමරය සඳහා එක් ලංසුපතක් නිකුත් කර තිබූ අතර එම ලංසුපත ලැබී තිබුණි. එහි ලංසුව ලෙස බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි පී.එම්.රවුෂාන් මහතා රු.162,850.00 මුදලක් දක්වා තිබූ අතර එම ලංසුව පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කළ අතර ඒ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය හිමි විය.

- 2020 වර්ෂය සඳහා පොදු වෙළෙඳසැල අංක 17 දරණ කුකුල් මස් කඩ කාමරය වෙනුවෙන් කිසිදු ලංසුපතක් නිකුත් නොවූ අතර ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ගය මහ සභාව මඟින් තීරණය කිරීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

**04:02 2020 වර්ෂය සඳහා ගල් වැලි හා ඉදිකිරීම් අයිතම සඳහා කැඳවූ මිළ ගණන් විවෘත කිරීම.**

- ඒ අනුව සැපයුම්කරුවන් හය දෙනෙකුගෙන් මිළ ගණන් ලැබුණු අතර ඒ ඒ අයිතමයන් සඳහා තෝරා ගනු ලැබූ සැපයුම්කරුවන් පහත පරිදි වේ.

**බී.එම්.යූ. නිශාන්ත කන්ස්ට්‍රක්ෂන්**

| | | |
|---|---|---|
| 6x9 කළු ගල් | - | රු.3,700.00 |
| 1" කළු ගල් | - | රු.6,000.00 |
| 1 1/2" කළු ගල් | - | රු.6,000.00 |
| ABC මිශ්‍රණය | - | රු.5,990.00 |
| ගඩොල් | - | රු. 12.00 |
| ගංගා වැලි | - | රු.9,500.00 |
| 1/4" චිප්ස් | - | රු.5,700.00 |

**සිසිර කන්ස්ට්‍රක්ෂන්**

| | | |
|---|---|---|
| 4" කළු ගල් | - | රු.5,500.00 |
| 2" කළු ගල් | - | රු.6,400.00 |

**තිරණ සප්ලයර්ස්**

| | | |
|---|---|---|
| 3/4" කළු ගල් | - | රු.6,900.00 |
| 3/4" ක්‍රෂර් කළු ගල් | - | රු.6,900.00 |
| 1/2" කළු ගල් | - | රු.5,750.00 |
| ගල්කුඩු | - | රු.5,700.00 |
| අන්තර් බන්ධන කොන්ක්‍රීට් ගල් (40N) | - | රු. 45.00 |
| අන්තර් බන්ධන කොන්ක්‍රීට් ගල් (25N) | - | රු. 45.00 |
| අළු හුණු 25kg | - | රු. 300.00 |
| තම්බපු හුණු 25kg | - | රු. 400.00 |
| පස් | - | රු.1,200.00 |
| බොරළු | | රු.2,000.00 |
| 1-4".0.8x0-6 පුරවපු ගල් | - | රු. 44.00 |
| 1/4"චිප්ස් | - | රු.5,700.00 |

**සන්මැක්**

| | | |
|---|---|---|
| බ්ලොක් ගල් 14x46 | - | රු. 44.00 |
| 1-4-0-8"๐0"-4 පුරවපු ගල් | - | රු. 44.00 |

ඒ අනුව අවම මිළ ගණන් යටතේ 2020 වර්ෂය සඳහා මිළදී ගැනීම් සිදු කිරීමට සභාවේ ඒකමතික අනුමැතිය හිමි විය.

**04:03 2020 වර්ෂය සඳහා නගර සභාව සතු වාහන රක්ෂණය කිරීම සඳහා ලැබී ඇති මිළ ගණන් අනුව රක්ෂණ සමාගමක් තෝරා ගැනීම.**

2020 වර්ෂය සඳහා නගර සභාව සතු වාහන රක්ෂණය කිරීම සඳහා ආයතන හතරකින් මිළ ගණන් ලැබී තිබුණු අතර එහිදී අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ අග්‍රහාර රක්ෂණ සමාගමේ මිළ ගණන් පිළිගන්නා ලදී.

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 226-7521 | 5,288.00 |
| 227-5020 | 9,237.99 |
| RD - 8240 | 6,966.50 |
| ZA -0228 | 8824.97 |
| 56-1906 | 6670.00 |
| LL - 7688 | 12,632.62 |
| HF - 8558 | 2,918.00 |
| GK-1483 | 3,510.00 |
| GK-6227 | 3,510.00 |
| RB – 4786 | 4,066.36 |
| LL-2110 | 19,350.00 |
| ND-5124 | 38502.00 |
| PF-4006 | 40850.00 |
| QL-2901 | 2,310.50 |
| RC-1107 | 4,300.00 |
| RC-1118 | 3,510.00 |
| RC-8183 | 3,510.00 |
| RE-2600 | 6,480.81 |
| VI – 1833 | 4,845.00 |
| JD – 4684 | 2,472.50 |
| UQ – 1933 | 3,020.00 |
| HF – 8952 | 2,918.00 |
| RD -8000 | 6,966.50 |
| 37-7933 | 1,930.00 |
| RV – 8543 | 1,694.00 |
| RW -1639 | 2,270.00 |
| 44-7142 | 830.00 |
| RW-5784 | 1,630.00 |
| RW-1962 | 2,000.00 |
| 67-1565 | 734.00 |
| 46-3164 | 990.00 |
| 46-4907 | 926.00 |
| HI-2234 | 830.00 |
| HI-2269 | 863.74 |
| RX-2069 | 2,430.00 |

| | |
|---|---|
| RX-2332 | 2,430.00 |
| RX-4400 | 4,400.00 |
| 67-3301 | 942.99 |
| ZA-5326 | 17,000.11 |

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද ඉහතින් ලබා ගන්නා තීරණ සියල්ල ගරු සභාපතිතුමා විසින් නැවත සභාවට ඉදිරිපත් කරමින් සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05. කල්දී ඇති ප්‍රශ්න**

**05:01 ගරු නාගරික මන්ත්‍රීනි තරංගනී සමරසේකර මැතිතුමිය**

**05:01:01 බස්නැවතුම්පලට වෙන් කරන ලද ජෙනරේටරයට සිදු වී ඇත්තේ කුමක්ද?**

ඉහත ප්‍රශ්න සඳහා පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමන් නගර සභාව සතු ජෙනරේටරය මේ වන විට බළන්ගොඩ තානායම සතුව පවතින බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් බස්නැවතුම්පල සඳහා වෙන්කර ඇති ජෙනරේටරය පෞද්ගලික ව පරිහරණය කරන ස්ථානයක නොතබා වැඩි පිරිසක් ප්‍රයෝජනයක් ලබා ගන්නා බස්නැවතුම්පල සඳහා යෙදවීම හෝ එසේ නොමැතිනම් වෙනත් ජෙනරේටරයක් බස්නැවතුම්පල සඳහා ලබා ගැනීම සුදුසු බව පවසන ලදී.

**05:01:02 හුනුකුඹුර මාර්ගයේ යූ.පී.සිල්වා මල්ශාලාවට යාබද පාලම අසල ඉදිකර ඇති බැම්ම සඳහා නගර සභාව හෝ පළාත් සභාවේ ප්‍රතිපාදන වෙන්කර ඇත්ද වෙන්කර ඇත්නම් එහි ප්‍රමාණය කොපමණද?**

මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමන් පවසා සිටියේ මෙම කර්මාන්තය නගර සභාව මඟින් ක්‍රියාත්මක නොවූ කර්මාන්තයක් බවයි.

**05:01:03 මුගුණමලේ සුසාන භූමිය පවරා ගැනීම සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය කුමක්ද ?**

මෙහිදී පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා සඳහන් කළේ මුගුණමලේ සුසාන භූමිය සම්බන්ධ ඉඩමේ කැඩැස්තර ඡායා පිටපත, ඉඩමට ළඟාවිය හැකි මාර්ග විස්තරය හා පාරිසරික අනුමැතිය ලබාදීමට අවශ්‍ය වන අයදුම්පත්‍රය සකස් කර රත්නපුර මධ්‍යම පරිසර අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර ඇති බවයි.

**05:01:04 ට්‍රැක්ටර් ගමන් කළ නොහැකි මාර්ගවල කසළ එකතු කිරීම පිණිස නගර සභාව ගන්නා පියවර කුමක්ද?**

මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු ලබා දෙමින් නගරය ආසන්නයේ ඇති මාර්ග වල අත් කරත්ත මඟින් කුණු කසළ එකතු කරන බව පවසා සිටි ගරු සභාපතිතුමා ට්‍රැක්ටර් ගමන් කළ නොහැකි මාර්ගයන්හි කුණු කසළ එකතු කිරීම සඳහා Truck රථයක් ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව පවසන ලදී.

**06. කල් දී ඇති යෝජනා**

**06:01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

**06:01:01 2020 වර්ෂයේ අයවැය කෙටුම්පත දෙවන වර සභාවට ඉදිරිපත් කිරීම.**

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, 2020 වර්ෂයේ අයවැය ප්‍රකාශය පළමුවර කියවූ 2019-11-26 වන දින ද අයවැය ලේඛනයේ තිබෙන ගැටළු, ප්‍රශ්න ආදියි තිබේනම් ඒ සඳහා සංශෝධන ඉදිරිපත් කරන ලෙස ගරු සභාවෙන් ඉල්ලීමක් කළ නමුත් එසේ සංශෝධන කිසිවක් ඉදිරිපත් නොකර දේශපාලනික හේතූන් මත එය පරාජයට පත්කළ බව පවසන ලදී.

එමෙන්ම එම අයවැය දෙවන වරට අද දින ඉදිරිපත් කරන බැවින් මෙම අයවැය සම්බන්ධ සංශෝධන තිබේනම් ඉදිරිපත් කරන ලෙසත්, මෙවර අයවැය පරාජයට පත්වුව ද නගර සභා ආඥා පනත පරිදි සභාවට යා හැකි කාලයක් පවතින බවත් පවසන ලදී. එමෙන්ම මෙම අයවැය තමාගේ, කාර්යාලයේ හෝ ගරු මන්ත්‍රීවරුන්ගේ සුබ විහරණය සඳහා නොව මහජනතාවගේ සුභ සිද්ධිය උදෙසා ඉදිරිපත් කරන බවද, අද දින ගරු මන්ත්‍රීවරුන් මෙම අයවැය සඳහා විරුද්ධ වන්නේ නම් එයින් සිදු වන්නේ බදු ගෙවන ජනතාවගේ එදිනෙදා අවශ්‍යතාවයන් හා ඔවුන් සඳහා සැපයිය යුතු සේවාවන් අත්හිටුවීමක් බැවින් මෙය බදු ගෙවන ජනතාවට අසාධාරණයක් සිදු කිරීමට දරණ ප්‍රයත්නයක් බව ද පවසන ලදී.

මෙවර අයවැය පරාජයට පත්වුවහොත් එය පළාත් පාලන යාන්ත්‍රණයටම සිදුවන කළු පැල්ලමක් බවත්, අදට පමණක් නොව ඉදිරියටත් මෙය වැරදි පූර්වාදර්ශයක් වන අතර එයින් නගර සභා ආඥා පනත ද හැල්ලුවට ලක් වන බවත් පැවසූ ගරු සභාපතිතුමා තමා පිළිබඳ වැරදි අවබෝධයක් ඇති කර නොගන්නා ලෙසත්, තමා සභාපති වශයෙන් තම නිල රථය පමණක් භාවිතා කළ අතර සභාපති යන තනතුර ලංකාවේ කිසිඳු ස්ථානයක දී භාවිතා නොකරන බව ද තමාගේ හෝ තම පවුලේ ප්‍රයෝජනය සඳහා සභාවේ කිසිම දෙයක් ප්‍රයෝජනයට නොගත් බව ද පවසන ලදී. එබැවින් සියලු දෙනාම බුද්ධිමත්ව කල්පනා කර මෙම අයවැය සඳහා සංශෝධන තිබේනම් ලබා දෙන ලෙස ද ඉදිරි වර්ෂය අවසානයේ දී වෙනත් පුද්ගලයෙකු සඳහා අවස්ථාව ලැබෙන බව ද පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, සභාවේ සියලු කාර්යයන් බදු ගෙවන ජනතාවට බෙදී යන ආකාරයට සිදු කරන බවද පළාත් සභා නිර්ණායක අනුව මෙන්ම සියලු මන්ත්‍රීවරුන් සහ පුරවැසි කමිටුවල සාමාජිකයන් සහභාගි කර ගනිමින් සහභාගිත්ව අයවැයක් සකස් කර ඇති බැවින් ඕනෑම සංශෝධනයක් ලබා දෙන ලෙස ද පැවසීය. එමෙන්ම මෙම අයවැය අනුව ඉදිරි වැඩ කටයුතු සිදු කිරීමට සූදානම් වන බැවින් තමාට ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා අදහස් දක්වමින් 2019 වර්ෂය සඳහා ඉලක්ක ගත ආදායම 100% ක් සපුරා ගෙන ඇත්දැයි විමසා සිටි අතර තමා සුනබ පාලනය, බළන්ගොඩ නගරයේ අතුරු මාර්ගවල දැන්වීම් පුවරු සවි කිරීම, දුනුමඩලගහවත්ත මාර්ගයේ කාණු පද්ධතිය සකස් කිරීම, ධර්මානන්ද පිරිවෙන අසලින් ආරම්භ වන කුමාරගම මාර්ගය සංවර්ධනය කිරීම ආදී යෝජනා ගණනාවක් සභාවට ඉදිරිපත් කළ නමුත් එම යෝජනා ක්‍රියාත්මක නොවූ බව පවසන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා අදහස් දක්වමින් යම් කිසි ආදායමක් ලැබේයැයි උපකල්පනයක් සිදු කර ඉලක්ක ගත ආදායම සකස් කරන බැවින් ඉලක්ක ගත ආදායමෙන් 100%ක්ම ආදායම් අයකර ගැනීමට නොහැකි බව පවසන ලදී.

නැවත වරක් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා, ගරු සභාපතිතුමා මෙවර අයවැය කථාව තුළ මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ලබා දෙන මුදල් තම කොට්ඨාශයේ සංවර්ධන කටයුතු සඳහා පමණක් යොදවන ලෙස පැවසුවද, නගර සභා බල ප්‍රදේශයේ පවතින කොට්ඨාශ දහය සඳහා තේරී පත්වූ මන්ත්‍රීවරු දසදෙනාට අමතරව සභාවේ සිටින ඉතිරි මන්ත්‍රීවරු හත්දෙනා නගර සභා සමස්ථ බල ප්‍රදේශයම නියෝජනය කරන බව පැවසීය. එමෙන්ම ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් පත් වූ තමා සෑම කොට්ඨාශයක් සඳහාම වග කිව යුතු බැවින් පක්ෂය සඳහා ඡන්දය ලබා දුන් ජනතාවට අසාධාරණයක් නොවන පරිදි සෑම කොට්ඨශයක්ම ආවරණය වන පරිදි යෝජනා ඉදිරිපත් කළ යුතු බව ද පවසන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පවසා සිටියේ එසේ ගැටලු වලට මුහුණ දුන් මන්ත්‍රීවරුන් තමා සමග සාකච්ඡා කර සංවර්ධන යෝජනා පමණක් ලබා දිය හැකි බවත්, මෙම ගැටලුව විශාල වශයෙන් බලපානුයේ වැසිකිළි ආධාර හා නිවාස ආධාර ලබා දීමේදී බවත් පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා ආදායම් ලැබිය හැකි සියළු දේපල තක්සේරු කර නොමැති බැවින් සභාවට ලැබෙන ආදායම අඩු වී ඇති බව ද ඉඩම් තක්සේරු නොකිරීම නිසා වරිපනම් බදු නොගෙවන විශාල පිරිසක් සිටින බවද පවසන ලදී.
මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පවසා සිටියේ අදාළ තක්සේරු කිරීම සිදු කරනුයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් බවයි.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් තමා බළන්ගොඩ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා 2020 වර්ෂයේ අයවැය පළමුවර කියවීමට පක්ෂව ඡන්දය ලබා දුන් අතර පළාත් පාලන ආයතනයක් යනු මිනිසාගේ උපතේ සිට මරණය දක්වා සේවාවන් සිදු කරන ස්ථානයක් වන බැවින් ඒ ගැන සිතමින් ගරු සභාපතිතුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලය විසින් කාලෝචිත අයවැයක් ඉදිරිපත් කර ඇති බව පවසන ලදී. එබැවින් මෙවර අයවැය සඳහාද තමාගේ සම්පූර්ණ සහයෝගය ලබා දෙන බව පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින්, බලය නොමැති වීම හෝ වෙනත් හේතුවක් නිසාවෙන් අද දින අයවැය පරාජයට පත්වුවද මෙම වසර අවසාන වීමට පෙර ගරු සභාපතිතුමාට තීරණයක් ගත හැකි නිසා වෙනත් සභාපතිවරයෙක් පත්කර ගෙන මෙම සභාව ඉදිරියට ගෙන යා හැකි බැවින් ජනතාවට අසාධාරණයක් සිදු නොවන බව පවසන ලදී.

එමෙන්ම 2020 වර්ෂයේ අයවැය පළමුවර කියවූ දිනයේම අයවැය ලේඛනය ලබා දීම පිළිබඳ තමන් චෝදනා කළ අතර නගර සභා ආඥා පනතේ කුමන ආකාරයට තිබුණද ප්‍රායෝගිකව එසේ ඉදිරිපත් කිරීමෙන් සංශෝධන ඉදිරිපත් කරන්නේ කෙසේදැයි විමසන ලදී.

2020 අයවැය ලේඛනය පිළිබඳ ගණකාධිකාරිතුමාගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු සභාපතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

ගණකාධිකාරිතුමාගෙන් කරුණු විමසීමෙන් අනතුරුව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු සභාපතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත් කර ගන්නා ලදී.

අනතුරුව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රීතුමා, ගරු සභාපතිතුමා අයවැය පැරදුණ පසුව නාමිකව සභාපති වන අතර ජනාධිපති, අගමැති, කැබිනට් මණ්ඩලය, පළාත් සභාව හෝ ආණ්ඩුකාර යන තනතුරු කිසිවක් ගරු සභාපතිතුමාගේ පක්ෂයේ නොමැති යුගයක ගරු සභාපතිතුමා හට බලයක් නොමැති බව ද පවසන ලදී. එමෙන්ම මෙම සභාවෙහි බලය තම පක්ෂය සතු බැවින් මෙවර අයවැය පරාජය කරන බවද තම පක්ෂය මඟින් ජනතාවට සේවය කරන බව ද පැවසූ ගරු මන්ත්‍රීතුමා 2018 වර්ෂයේ අයවැය මඟින් වෙන් කළ මුදලින් ලක්ෂ 4 ක පමණ මුදලක් මන්ත්‍රී ප්‍රතිපාදන වශයෙන් ලබා දුන් නමුත් 2019 වර්ෂයේදී කිසිඳු මුදලක්

මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස ලබා නොදී 2020 වර්ෂයට අදාළ අයවැය පළමුවර කියවීමෙන් පසුව සංවර්ධන යෝජනා ඉල්ලා ලිපියක් එවා තිබූ අතර එය අල්ලසක් වන බව ද පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රීතුමා, ගරු සභාපතිතුමාට කිසිඳු බලයක් නොමැතිව ඉදිරියට යා නොහැකි බවද, 2019 වර්ෂයේදී ගරු සභාපතිතුමාගේ යෝජනා සඳහා පමණක් ලක්ෂ 38 ක මුදල් ප්‍රතිපාදනයක් ලබා දීම යන කරුණු අයවැය පරාජය කිරීමට හේතු වන බව පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

අනතුරුව 2020 වර්ෂයේ අයවැය දෙවන වර කියවීම සඳහා බෙදීමක් අවශ්‍ය බවට ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී  අකිල එල්ලාවල මැතිතුමා අදහස් දක්වමින්, ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දැක්වූ අවස්ථාවේදී අයවැය ලේඛනය පිළිබඳ හොඳ විශ්ලේෂණයක් සිදු කළ අතර එය ජනතා නියෝජිතයෙකුගේ යුතුකමක් හා වගකීමක් වන බැවින් එය හොඳ ආදර්ශයක් බව ද පවසන ලදී.

එමෙන්ම ඇල්ලෙපොල කොට්ඨාශය නියෝජනය කරමින් තේරී පත් වූ සුගත් ඉන්ද්‍රජිත් මැතිතුමාගේ අභාවයෙන් පසු තමා සභාවට පත්වූ අතර එසේ තමා සභාවට පැමිණ අවුරුද්දකට වඩා වැඩි කාලයක් ගත වී ඇති නමුත් තමාට 2018 වර්ෂයේදී රු.160,000.00 ක මුදලක් පමණක් මන්ත්‍රී ප්‍රතිපාදන වශයෙන් ලැබුණු බව පවසන ලදී. එමෙන්ම 2019 වර්ෂයේදී සෑම කොට්ඨාශයක් සඳහාම මන්ත්‍රී ප්‍රතිපාදන ලබා දී ඇති නමුත් ඇල්ලෙපොල කොට්ඨාශය සඳහා පමණක් මන්ත්‍රී ප්‍රතිපාදන ලබා දී නොතිබෙන්නේ එම කොට්ඨාශය නගර සභා සීමාවෙන් ඉවත් කර ඇති කොට්ඨාශයක්  ද යන්නත් විමසන ලදී.

එසේම තමා මාලිගාතැන්න කුෂන් කඩය ඉදිරිපිට කුමුදු කුමාර මහතාගේ නිවස අසළ මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා යෝජනාවක් ලබා දුන් නමුත් එක් පුද්ගලයෙකුගේ විරෝධතාවය මත නිවාස කිහිපයකට යන එම මාර්ගය සංවර්ධනය කිරීමේ කටයුතු නතර කිරීම අසාධාරණ ක්‍රියාවක් වන බැවින් ගරු සභාපතිතුමා විසින් එහි සම්පූර්ණ වගකීම භාරගත යුතු බව පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා පසුගිය සෙනසුරාදා දින නගරය පවිත්‍ර කිරීමේ වැඩසටහන සඳහා නගර සභාව මඟින් ලබා දුන් සහයෝගය සම්බන්ධව ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වන බව පැවසීය.

එමෙන්ම බස්නැවතුම්පල වහලයේ පරවියන් විශාල වශයෙන් සිටින බව ද බස්නැවතුම්පල සිවිලිම නිසියාකාරව අවසන් නොකර සිදු කර තිබෙන විනාශය සඳහා සභාවේ සියළු මන්ත්‍රීවරුන් වගකිව යුතු බව සඳහන් කළේය. එසේම  බස්නැවතුම්පලෙහි නිසි පරිදි වැසිකිළි

හා විදුලි බල්බ නොමැති බව ද බස් නැවතුම්පළ තුල පාසල් දරුවන් විසින් මත් කුඩු භාවිත කරන බවද පැවසූ අතර, බුලත් කෙළ ගැසීම නිසා බස්නැවතුම්පල බිත්ති අපවිත්‍ර වී ඇති බව ද පවසන ලදී. පළාත් පාලන ආයතනවල බලය ගරු සභාපතිතුමාට පමණක් තිබෙන අතර අනෙකුත් සභිකයන් සඳහා කිසිම බලයක් නොමැති බැවින් ගරු සභාපතිතුමා මේ පිළිබඳව මීට වඩා වගකීමෙන් කටයුතු කළේනම් සුදුසු බව පවසන ලදී.

අනාගතය භාර ගැනීමට සිටින පාසල් දරුවන් විසින් අනෙකුත් පාසල් දරුවන්ගෙන් කප්පම් ගන්නා තත්ත්වයකට අද බළන්ගොඩ නගරය පත්ව ඇති බව ද බළන්ගොඩ ප්‍රධාන පුරවැසියා ලෙස ගරු සභාපතිතුමා ඒ පිළිබඳව මීට වඩා වගකීමෙන් කටයුතු කරන ලෙසද පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා මෝටර් ග්‍රේඩරයට යම්කිසි හානියක් සිදු වී තිබේනම් ඒ පිලිබඳව සොයා බලන ලෙස පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා, ගරු සභාපතිතුමා විසින් 2019 වර්ෂයේදී තමන්ගේ සංවර්ධන කටයුතු සඳහා තනිවම ලක්ෂ 38 ක මුදලක් වියදමක් කර ඇති අතර ඉතිරි මන්ත්‍රීවරු 16 දෙනාගෙන් 9 දෙනෙකුට පමණක් මන්ත්‍රී ප්‍රතිපාදන ලබා දී ඇති බව පවසන ලදී. එමෙන්ම ගරු සභාපතිතුමා සමග පෞද්ගලික තරහක් නොමැති නමුත් පක්ෂයක් ලෙස අයවැයට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කර සිටින බව පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් 2020 අයවැය පළමුවර කියවූ දින සභාවට පැමිණි අවස්ථාවේදී අයවැය ලේඛනය ලබා දුන් අතර එය ඉදිරිපත් කළ ක්‍රමය වැරදි සහගත බව ද මෙම අයවැය තුළද 1996-1997 වර්ෂ වලදී ඉදිරිපත් කළ කරුණුම අන්තර්ගත වී ඇති බව ද පවසන ලදී.

එමෙන්ම 2018 වර්ෂයේදී සභාව පත්වී පැමිණෙන විට ලක්ෂ 10ක මුදලක් වෙන්කර තිබූ නමුත් එයින් ලක්ෂ 4 ක ප්‍රමාණයක් පමණක් ලබා දුන් බවත්, 2019 වර්ෂයේදී ගරු සභාපතිතුමා විසින් කාණු හා නඩත්තු යෝජනා සඳහා පමණක් රුපියල් එක්කෝටි පනස් එක්ලක්ෂයක් වෙන් කර ගෙන ඇති අතර, 2019 වර්ෂයේ ඉටු කළ සංවර්ධන යෝජනා අතුරින් වැඩි ප්‍රමාණයක් ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනා වන බව පවසන ලදී. මීට අමතරව ක්‍රීඩා පිටිය සඳහා විදුලි ආලෝකය ලබා ගැනීම වෙනුවෙන් පළාත් සභා මුදල් වෙන් කළ බව පැවසුවද ඒ සඳහා සභා අරමුදල් යොදවා ඇති බව සඳහන් කළේය.

මෙහිදී පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා පවසා සිටියේ ක්‍රීඩා පිටිය සඳහා විදුලි ආලෝකය ලබා ගැනීම වෙනුවෙන් මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීම සදහා අවශ්‍ය බිල්පත් සකස් කර පළාත් සභාව වෙත යවා ඇති අතර ඉදිරියේ දී එම මුදල් ප්‍රතිපූර්ණය වන බවයි.

වැඩිදුරටත් අදහස් දක්වමින් නගර සභා පෙරපාසල් පාලිකාව ලබන වසරේදී විශ්‍රාම යාමට නියමිත බැවින් පෙර පාසල අපහසුවකින් තොරව පවත්වා ගෙන යාම සඳහා සභාව මඟින් එක් අයකුගේ නමක් අනුමත කර ලබා දුන්න ද මේ වන තෙක් ඇයව බඳවා ගෙන නොමැති බවත්, මේ වන තෙක් වැසිකිළි ආධාර හා ශිෂ්‍යාධාර නොලැබුනු බවත් පැවසූ අතර අද දින අයවැයට විරුද්ධව තම ඡන්දය ප්‍රකාශ කරන බව පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් සුගත් ඉන්ද්‍රජිත් මැතිතුමා අභාවප්‍රාප්ත වීමට පෙර සභාවට යෝජනා ගෙන ආ බව ද එතුමාට උපහාරයක් ලෙස බැම්මක් ඉදිකරන බවට පැවසුවද මේ වන තෙක් එම බැම්ම සකස් නොකළ බව ද පවසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පුබුදමු ගම්මැද්ද වැඩසටහන සිදු කළේ ප්‍රධාන වශයෙන් වරිපනම් බදු ආදී ගෙවීම් පැහැර හරින දෙහිගස්තලාව කොට්ඨාශය ඉලක්ක කර ගෙන බව පවසන ලදී.

නැවත වරක් අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රීතුමා පවසා සිටියේ එමඟින් වරිපනම් බදු ගෙවන ජනතාව වෙත අසාධාරණයක් වී ඇති බවයි.

**ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා**

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අදහස් දක්වමින් එක්සත් ජාතික පක්ෂයේ ජ්‍යෙෂ්ඨ නායකයෙකු සිටින දෙහිගස්තලාව කොට්ඨාශය සඳහා පුබුදමු ගම්මැද්ද වැඩසටහන යටතේ මෙන්ම කර්මාන්ත කමිටු හරහා ද විශාල අසාධාරණයක් වූ බව පැවසීය. 2019 වර්ෂයේදී සමස්ථ යෝජනා 24 ක සංවර්ධන කටයුතු සිදු කර ඇති අතර එයින් කාර්යාලයේ සංවර්ධන කටයුතු හතරක් වන බව ද ඉතිරි යෝජනා 20න් යෝජනා 10ක්ම ගරු සභාපතිතුමාගේ යෝජනා වන බව ද පැවසූ ගරු උප සභාපතිතුමා, ගරු සභාපතිතුමා විසින් තනිවම ලක්ෂ 38 ක සංවර්ධන කටයුතු කර ඇති අතර සියලු කොට්ඨාශයන්හිම සභාපති වශයෙන් එසේ සිදු කළ යුතු වුව ද අනෙක් මන්ත්‍රී යෝජනා ද ඉටු කළ යුතු බව පවසන ලදී. එමෙන්ම අනෙකුත් කොට්ඨාශයන්හි සංවර්ධන කටයුතු සිදු කිරීමේදී එම කොට්ඨාශයේ මන්ත්‍රීවරයාට ප්‍රමුඛස්ථානය දිය යුතු බව ද සුබයිර් ආලීම් මාවත දෙවන පටුමග අවසන් අදියර සංවර්ධනය කිරීමට ඇස්තමේන්තු සකස් කර කිහිපවරක් ලබා දුන් බව ද, ගරු සභාපතිතුමා අනෙකුත් මන්ත්‍රීවරුන් සමඟ එක්ව ගමනක් යා යුතු බව ද පවසන ලදී.

එමෙන්ම බළන්ගොඩ නගරය අපේ නගරය වන බැවින් නාගරික සංවර්ධන අධිකාරියට හා මාර්ග සංවර්ධන අධිකාරියට අවශ්‍ය ලෙස කටයුතු නොකරන ලෙසත් ඉතාමත් අක්‍රමවත් ලෙස පැවති ඔරලෝසු කණුව අසළ වට රවුම හා පරණ කොමර්ෂල් බැංකුව අසළ වට රවුම මේ වන විට සකස් කර ඇති බව ද පවසන ලදී.

නගරය පිරිසිදු කිරීමේ වැඩසටහන සඳහා පසුගිය සෙනසුරාදා දින බස්නැවතුම්පලට ගිය අවස්ථාවේ දී කසළ බැහැර කරන ස්ථානයෙහි කසළ බැහැර කළ නොහැකි පරිදි වෙනත් ද්‍රව්‍ය තබා ඇති බව ද, බස්නැවතුම්පලෙහි අත් කරත්තය නවතා තිබෙන ස්ථානයේ විශාල අපද්‍රව්‍ය තොගයක් පවතින බව ද දක ගන්නට ලැබුණු බව සඳහන් කළ ගරු උපසභාපතිතුමා මේ පිළිබඳව අධීක්ෂණය කිරීමට ගරු සභාපතිතුමාට වගකීමක් පවතින බව පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වන ලද ගරු උප සභාපතිතුමා අයවැයක් පැරදුණ පසුව සභාවට ඉදිරියට යා නොහැකි බවද දයාසිරි ජයසේකර මැතිතුමා එ.ජා.ප යට සහයෝගය නොදෙන ලෙස ලිඛිතව දැනුම් දුන් බව ද එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අයට සහයෝගය නොදෙන බව පැවසූ නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ද එක්සත් ජාතික පක්ෂයේ අයට සහයෝගය නොදෙන බව පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් මෙම අයවැයෙහි අඩංගු වන්නේ බළන්ගොඩ නගරයේ බදු ගෙවන ජනතාවට කළ යුතු සේවාව වන අතර අනවශ්‍ය කිසි දෙයක් එහි නොමැති බැවින් තමන් අයවැයට පක්ෂව ඡන්දය ලබාදෙන බව පවසන ලදී. එමෙන්ම හිටපු සභාපතිතුමාගේ පාලන කාලයේ දී තම පක්ෂ මූලස්ථානය වන සිරිකොත මඟින් එක් අවස්ථාවකදී අයවැයට විරුද්ධව ඡන්දය භාවිත කරන ලෙස ලිපියකින් දැනුම් දුන්න ද සියලු දෙනා එක්ව සකස් කළ අයවැයට එසේ විරුද්ධව ඡන්දය ලබා දිය නොහැකි බැවින් එම අවස්ථාවේ දී තමන් අයවැයට විරුද්ධ නොවූ බව පැවසීය.

එසේම 2002 වසරේ දී මෙම සභාව පළාත් සභාවේ මෙන්ම ආණ්ඩුවේ බලය නොමැතිව පවත්වාගෙන ගෙන ගිය අතර, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ කොට්ඨාශ හතක් ජයග්‍රහණය කර විපක්ෂයේ වාඩිවී සිටින බවත් පවසන ලදී.

එමෙන්ම 2018 වර්ෂයේදී දෙහිගස්තලාව කොට්ඨාශය සඳහා තමාටත් වඩා ගරු උප සභාපතිතුමාට ප්‍රතිපාදන ලබා දී ඇති ඇති නමුත් 2019 වර්ෂයේදී කිසිඳු මුදලක් ලබා දී නොමැති බව ගරු උප සභාපතිතුමා පැවසූ බවට දිවයින පුවත්පතේ සඳහන් වී ඇති බව පවසන ලදී. එමෙන්ම ගරු සභාපතිතුමා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට වඩා විපක්ෂයේ මන්ත්‍රීවරුන් සඳහා සැලකු බවද එබැවින් ඉදිරියටත් විපක්ෂය සඳහා සහය ලබා දෙමින් මෙම සභාව කරගෙන යාම සඳහා තම පක්ෂයේ සම්පූර්ණ සහය ගරු සභාපතිතුමාට ලබා දෙන බව පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රීතුමා තමන් මෙම සභාවෙන් හම්බකරගෙන නොමැති බවද තමන්ට තම මන්ත්‍රීධූරය තිබුණද නොතිබුණද ප්‍රශ්නයක් නොමැති බවද තම

පරම්පරාව කිසිඳු දෙයක් බදා ගත් අය නොවන අතර අවශ්‍ය දේ ජනතාවට ලබා දී ඇති බවද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් තමාට කිසිම කණගාටුවක් හෝ විශේෂ සතුටක් නොමැති බව ද සහෝදරයන් සේ සිටි මන්ත්‍රීවරු අද වෙනස් වී ඇති අතර කන්න ඕනි වුණාම කබරගොයත් තලගොයා වෙන බව පවසා සිටින ලදී. එමෙන්ම උප සභාපතිතුමා තෝරා පත් කර ගන්නා අවස්ථාවේදී විශේෂ හේතුවක් මත නිමල් ගාමිණි වීරසිංහ මැතිතුමා පත් කිරීමට සිටි නමුත් රූමි මැතිතුමා තලතා අතුකෝරල මැතිතුමිය හමුවීමට ගොස් උප සභාපති තනතුර ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කළ බව ද, ඒ අනුව එතුමිය හරහා රූමි මැතිතුමා උප සභාපති ලෙස පත් කරන ලෙසට විශාල බලපෑමක් පැමිණි අතර භාණු මුණිප්‍රිය මැතිතුමා විසින් නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා උප සභාපති ලෙස පත් කර ගන්නා ලෙස සිය අත් අකුරින් ලිපියක් මගින් එවා තිබූ බවත් පවසන ලදී. එමෙන්ම එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු සියලු දෙනාටම අවශ්‍ය වූයේ නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා උප සභාපති ලෙස පත් කර ගැනීමට බව ද උප සභාපතිතුමා පත්කර ගන්නා අවස්ථාවේදී හිටපු සභාපතිතුමා විශාල අපහසුතාවයකට පත් වූ බව ද සඳහන් කළේය. එමෙන්ම තමාට විදේශ සංචාරක අවස්ථාවක් පවා පැමිණි අවස්ථාවේදී එම අවස්ථාව ගරු උප සභාපතිතුමාට ලබා දුන්නේ තමන් එම වරප්‍රසාද වලට ආශාවක් නොමැති නිසා බව වැඩිදුරටත් පැවසීය.

තමා හිටපු සභාපතිතුමා සමග ගැටුමක් ඇති කර ගත්ත ද සුලු කාලයකින් එය සිදී ගිය බව ද තමන් වසර එක හමාරක කාලයක් සඳහා සැලසුම් සකස් නොකළ අතර අවුරුදු හතරක කාලයක් සඳහා සැලසුම් සකස් කළ බව ද පැවසූ ගරු සභාපතිතුමා තමා සභාපති තනතුරට නවකයෙක් වීම හා තමන්ට එල්ල වූ බලපෑම් හේතුවෙන් ගරු උප සභාපතිතුමාව සම්බන්ධ කරගනිමින් ඉදිරි ගමන යාම සඳහා අපේක්ෂා කළ නමුත් මුල් කාලයේ ලැබුණු එතුමාගේ සහයෝගය පසුව නොලැබී මග හරින්නට වූ බව ද සඳහන් කළේය. එමෙන්ම ගරු උප සභාපතිතුමා තමා සමග අවසන් මොහොත වෙන තෙක් සිටින බවට පොරොන්දු වූ බැවින් තමා වෙතින් යම් අඩුපාඩුවක් සිදු වන්නේ නම් එය නිවැරදි කර දෙනු ඇතැයි බලාපොරොත්තු වූ බව වැඩිදුරටත් පැවසීය.

කෙසේ වුවත් සිදු වූ දේශපාලන පෙරළිය මත මෙම සභාව විශාල ලෙස වෙනස් වූ අතර අන් අය තමා වගේම යැයි සිතුවද දේශපාලන වාසි වෙනුවෙන් මිනිසුන් වැඩ කරන බව ද පවුලේ හතරවන පුරුක වන තමන්ට මෙයින් රැකෙන්න කිසිදු අවශ්‍යතාවයක් නොමැති අතර අද දින මෙම තත්ත්වයට පැමිණීම සඳහා හේතු වී ඇත්තේ තම පරම්පරාව දැන් පිරිසිදුව සිය දේශපාලනය කළ නිසා බව ද සඳහන් කළේය. තමන් දැනුවත්ව හෝ නොදැනුවත්ව සිදුවී ඇති වැරදි අඩුපාඩු තිබුණේනම් ඒවා නිරාකරණය කර ගැනීම සඳහා උත්සහ කළ බවත්, ඉදිරියේදී අවශ්‍ය කටයුතු නගර සභා ආඥා පනත ප්‍රකාරව සිදු කරන බවත්, අද වන විට ශ්‍රී ලංකාව තුල

නීතියක් හරියාකාරව නොමැති අතර මෙහි ඇලී ගැලී සිටීමට තමාට කිසිදු අවශ්‍යතාවයක් නොමැති බවත් පැවසීය.

එමෙන්ම නීතිය අවනීතිය බවට පත්වීමටත්, අවනීතිය නීතිය බවට පත්වීමටත් තමා වැඩ කටයුතු නොකරන අතර තමන් උසාවියට හෝ පොලීසියට ගියද බොරු කියා ඇඟ බේරා ගැනීමට හෝ නම බේරා ගැනීමට කටයුතු කර නොමැති බව ද වැරැද්ද වැරැද්ද ලෙස දැකීමටත් නිවැරදි දේ නිවැරදි දේ ලෙස දැකීමටත් තමා කටයුතු තර ඇති බව පැවසූ ගරු සභාපතිතුමා, වැරදි වැඩ සිදු කර නීතිය යටපත් කර අවනීතිය මතු කිරීමට කටයුතු නොකරන බව වැඩිදුරටත් සඳහන් කළේය. එමෙන්ම ඉදිරි කටයුතු පනත ප්‍රකාරව නීත්‍යානුකූලව සිදු කරන අතර අවනීතිය හමුවේ නීතියට කිසිම විටක පසුබැසීමට ඉඩ නොදෙන ලෙස ඉදිරියේ දී ද නීත්‍යානුකූලව නිසි පරිදි අවශ්‍ය කටයුතු සිදු කරන බව පැවසීය. ඒ අනුව අයවැයට විරුද්ධව අදහස් ඉදිරිපත් වී තිබීම හා ඡන්දයක් පැවැත්වීමට යෝජනාවක් සම්මත වී තිබීම නිසා විවෘත ඡන්දයකට යාමට අවස්ථාව ලැබෙන බව වැඩිදුරටත් පැවසීය.

2020 වර්ෂයේ අයවැය දෙවන වර කියවීම සඳහා එයට පක්ෂව හා විපක්ෂව අදහස් ඉදිරිපත් වූ බැවින් හා බෙදීමක් අවශ්‍ය බවට ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමාගේ ස්ථිරත්වයෙන් විවෘත ඡන්දයක් පැවැත් වූ අතර එහිදී යෝජනාවට පක්ෂව සභිකයින් හය දෙනෙක්ද, එනම්,

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. | ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 3. | ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 4. | ගරු නාගරික මන්ත්‍රි | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 5. | ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 6. | ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |

මෙහිදී යෝජනාවට විරුද්ධව සභිකයින් එකොළොස් දෙනෙක්ද, එනම්,

| | | |
|---|---|---|
| 1. | ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 2. | ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 3. | ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 4. | ගරු නාගරික මන්ත්‍රි | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |

| | | |
|---|---|---|
| 5. | ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. | ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 7. | ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 8. | ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 9. | ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 10. | ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 11. | ගරු නාගරික මන්ත්‍රී | අකිල එල්ලාවල මැතිතුමා |

ඡන්දය ලබා දෙන ලදී. ඒ අනුව **2020 වර්ෂයේ අයවැය දෙවන වර කියවීම වැඩි ඡන්ද පහකින් (05කින්) පරාජයට පත්විය.**

අනතුරුව ගරු සභාපතිතුමා ප්‍රකාශයක් සිදු කරමින් නගර සභා ආඥා පනතේ 178 (අ) වගන්තිය ප්‍රකාරව අයවැය සම්මත වූවා සේ සලකා කටයුතු සිදු කරන බවට ප්‍රකාශයක් සිදු කරන ලදී. මෙම සභාවෙහි ඉදිරි කටයුතු නීතිපතිවරයාගේ නීති උපදෙස් අනුව හා පනතට අනුව මෙන්ම පළාත් පාලන නීති අනුව කර ගෙන යාමට බලාපොරොත්තුවන බව පවසන ලදී.

**කාරක සභා පත්කිරීම**

**06ඃ01ඃ02 මුදල් කමිටුවට පැවරෙන බලතල හා විෂය පථය**

බළන්ගොඩ නගර සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන්ට අදාලව රුපියල් ලක්‍ෂ 05ක් දක්වා වූ වියදම් අනුමත කිරීම, රුපියල් ලක්‍ෂ 05 ක් දක්වා වූ ඇස්තමේන්තු අනුමත කිරීම, ගරු සභාපතිවරයා විසින් සිදු කරනු ලබන රු. ලක්ෂ 05 ක් දක්වා වූ ගෙවීම් වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබාදීම, කර්මාන්ත කමිටුව, පුස්තකාල හා උපදේශන කමිටුව, සෞඛ්‍ය සණ අපද්‍රව්‍ය හා පරිසර කමිටුව, සංවර්ධන උපදේශන කමිටුව යන කමිටු වලින් නිර්දේශ කරනු ලබන රු. ලක්‍ෂ 05 දක්වා වූ වියදම් සඳහා අනුමැතිය ලබාදීම, රු. 250,000.00 සිට රු. 500,000.00 දක්වා වූ ප්‍රසම්පාදන කමිටුව ලෙස ක්‍රියාත්මක වීම අවස්ථානුකුලව තාක්ෂනික ඇගයීම් කමිටුව පත්කිරීම.

නගර සභා ආඥා පනත, රජයේ විවිධ රෙගුලාසි, චක්‍රලේඛ, අතුරු ව්‍යවස්ථා හා රීතින් වලට අනුකූල වන පරිදි ආදායම් උත්පාදනය, ආදායම් ඒකරාශී කිරීම, වියදම් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම හා පාලනය කිරීම, මූල්‍ය ස්ථාවරත්වය ගොඩ නැගීම සඳහා වන යෝජනා ගරු සභාවට ඉදිරිපත් කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම උදෙසා

1. ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා
2. ගරු උප සභාපති එම්. ටී. එම්. රුැමි මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රි එම්. ජේ. මලීක්ෂා මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රිනී එම්. සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය
5. ගරු නාගරික මන්ත්‍රි එම්. ඩබ්. විමලසිරි මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රි ඩබ්. එම්. නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමා

යන සාමාජිකයන් අට දෙනෙකුගෙන් සමන්විත මුදල් කමිටුව පත් කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් ඉදිරිපත් කරන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ සභාවේ දී සාමාජිකයන් නම් කිරීම සඳහා විශාල කාලයක් වැය වෙන බැවින් මෙවර කමිටුවට පසුගිය වර්ෂයේ කමිටුවෙහි සාමාජිකයන්ම නම් කල අතර සංශෝධන තිබේනම් ඉදිරිපත් කරන ලෙසයි.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමා අදහස් දක්වමින් ගරු සභාපතිතුමාට නගර සභා ආඥා පනත පරිදි ඉදිරියට යා හැකි වුවත් ඉතිරි සභිකයන් 16 දෙනා නොසලකා හැර එසේ යා නොහැකි බව ද, අද දින පත්කර ගැනීමට නියමිත සෑම කමිටුවකම එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් බහුතරයක් සිටින නිසා මෙම කමිටු පත් කිරීමට විරුද්ධ වන බව ද අද දින සියලුම කමිටු සඳහා අලුතින් නම් යෝජනා කර ගනිමින් සෑම කමිටුවකම බහුතරය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වන සේ පත් කර ගත යුතු බවට ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම 2020 වර්ෂයේ කමිටු සඳහා නම් කර ඇති මන්ත්‍රීවරුන් සම්බන්ධව එකඟ නොවන බැවින් විපක්ෂය සඳහා වැඩි නියෝජනයක් ලැබෙන පරිදි අද දින කමිටු පත් කර ගැනීම සිදු කිරීමට එකඟත්වය ලබා දෙන ලෙස වැඩිදුරටත් පවසන ලදී.

ගරු නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් කමිටු සඳහා සාමාජිකයන් නම් කර පත්කර ගැනීම සභාවේ දී සිදු කිරීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා, ගරු සභාපතිවරයා විසින් සිදු කරනු ලබන රු. 10,000.00 ට වැඩි ගෙවීම් සඳහා සභාවේ පූර්ව අනුමැතිය ලබා ගෙන වියදම් කළ යුතු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව මුදල් කමිටුව සඳහා ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා හා ඊ.ඒ.ජයන්ත ප්‍රේම කුමාර මැතිතුමා පත් කිරීම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එහි දී ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය හා ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් තමන් මුදල් කමිටුවෙන් ඉල්ලා අස්වන බව පවසන ලදී.

නගර සභා ආඥා පනත, රජයේ විවිධ රෙගුලාසි, චක්‍රලේඛ, අතුරු ව්‍යවස්ථා හා රීතින් වලට අනුකූල වන පරිදි ආදායම් උත්පාදනය, ආදායම් ඒකරාශී කිරීම, වියදම් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම හා පාලනය කිරීම, මූල්‍ය ස්ථාවරත්වය ගොඩ නැගීම සඳහා වන යෝජනා ගරු සභාවට ඉදිරිපත් කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් කාර්යයන් සඳහා සුදුසු නිර්දේශ ලබා ගැනීම උදෙසා

2020 වර්ෂයේ මුදල් කමිටුවේ සාමාජිකයන් ලෙස,

1. ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා
2. ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රි එම්. ජේ. මලීක්ෂා මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රි වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රි එම්. ඩබ්. විමලසිරි මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රි ඊ.ඒ.ජයන්ත ප්‍රේම කුමාර මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රි ඩබ්. එම්. නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමා

යන සාමාජිකයන් පත් කර ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් ගෙන ආ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**06ඃ01ඃ03 කර්මාන්ත කමිටුව**

නගර සභාව විසින් බල ප්‍රදේශය තුළ ඉටු කළ යුතු කර්මාන්ත සම්බන්ධව ප්‍රමුඛතා හඳුනාගෙන නිර්දේශ කිරීම, ප්‍රගතිය අදාළ පරිදි මුදල් කමිටුවට හා ගරු සභාවට ඉදිරිපත් කිරීම, කර්මාන්ත පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීම, තෝරා ගන්නා ලද කර්මාන්තකරුවන් පිළිබඳ නිර්දේශ ලබාදීම යන කාර්යයන් ඉටු කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා

1. ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රි එම්. ජේ. මලීක්ෂා මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රිනී එම්. සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය
4. ගරු නාගරික මන්ත්‍රි එම්. ඩබ්. විමලසිරි මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රිනී, එම්. ජී. ශාන්තිලේඛා මැතිතුමිය.
9. ගරු නාගරික මන්ත්‍රිනී, පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය.
10. ගරු නාගරික මන්ත්‍රි, කේ. ජී. ප්‍රේමදාස මැතිතුමා.

යන සාමාජිකයන් දස දෙනෙකුගෙන් සමන්විත කර්මාන්ත කමිටුව පත් කිරීම

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

එමෙන්ම කර්මාන්ත කමිටුව සඳහා ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මුදල් කමිටුවේ සභාපති වශයෙන් ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා සුදුසු බවට ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රිනී, එම්. ජී. ශාන්තිලේඛා මැතිතුමිය හා ගරු නාගරික මන්ත්‍රිනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය කර්මාන්ත කමිටුවෙන් ඉල්ලා අස්වන බව පවසන ලදී.

ඒ අනුව නගර සභාව විසින් බල ප්‍රදේශය තුළ ඉටු කළ යුතු කර්මාන්ත සම්බන්ධව ප්‍රමුඛතා හඳුනාගෙන නිර්දේශ කිරීම, ප්‍රගතිය අදාළ පරිදි මුදල් කමිටුවට හා ගරු සභාවට ඉදිරිපත් කිරීම, කර්මාන්ත පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීම, තෝරා ගන්නා ලද කර්මාන්තකරුවන් පිළිබඳ නිර්දේශ ලබාදීම යන කාර්යයන් ඉටු කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් කාර්යයන් සඳහා සුදුසු නිර්දේශ ලබා දීම යන කරුණු උදෙසා 2020 වර්ෂයේ කර්මාන්ත කමිටුව ලෙස,

1. ගරු උප සභාපති එම්. ටී. එම්. රුමී මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලීක්ෂා මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රිනී එම්. සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය
4. ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
9. ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා
10. ගරු නාගරික මන්ත්‍රී, කේ. ජී. ප්‍රේමදාස මැතිතුමා.

යන සාමාජිකයන් පත්කර ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:01:04 පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව**

බළන්ගොඩ නගර සීමාව තුළ මහජනතාවට පොදුවේ බලපානු ලබන සෞඛ්‍ය ගැටලු පිළිබඳ සොයා බැලීම ඒවාට විසඳුම් යෝජනා කිරීම සහ නගරය පිරිසිදු කිරීම සම්බන්ධව පරීක්ෂා කිරීම හා වාර්තා කිරීම, බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම, වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ ලබාදීම, පාරිසරික සංරක්ෂණ කාර්යයන් හඳුනා ගැනීම සහ ඒ සඳහා නිර්දේශ සභාවට ඉදිරිපත් කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් කාර්යයන් සඳහා ඉටු කිරීම යන කරුණු උදෙසා

1. ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා
2. ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලීක්ෂා මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රිනී එම්. සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය
5. ගරු නාගරික මන්ත්‍රිනී, පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය.
6. ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා

ප්‍රජා නියෝජනත්වය

9. කේ. දයානි වීරසිංහ මිය
10. අශෝකා රත්නායක මිය
11. එච්.එම්.ෂියානා මිය
12. සුමනා වීරකොන් මිය.
13. එච්.ජේ. කුසුමා ජයසුන්දර මිය
14. ප්‍රියංකා ඒකනායක මිය

යන සාමාජිකයන් දහහතර දෙනෙකුගෙන් සමන්විත පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව පත් කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙම කමිටුව සඳහා ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පත් කිරීම සුදුසු බවට ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රිනී එම්. සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය හා ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුවෙන් ඉල්ලා අස්වන බව පවසන ලදී.

ඒ අනුව බළන්ගොඩ නගර සීමාව තුළ මහජනතාවට පොදුවේ බලපානු ලබන සෞඛ්‍ය ගැටලු පිළිබඳ සොයා බැලීම ඒවාට විසඳුම් යෝජනා කිරීම සහ නගරය පිරිසිදු කිරීම සම්බන්ධව පරීක්ෂා කිරීම හා වාර්තා කිරීම, බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම, වැඩි දියුණු කිරීම සඳහා

නිර්දේශ ලබාදීම, පාරිසරික සංරක්‍ෂණ කාර්යයන් හඳුනා ගැනීම සහ ඒ සඳහා නිර්දේශ සභාවට ඉදිරිපත් කිරීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් කාර්යයන් සඳහා සුදුසු නිර්දේශ ලබා දීම යන කරුණු උදෙසා 2020 වර්ෂයේ පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුව සඳහා

1. ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා
2. ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලීක්‍ෂා මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රිනී, පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය.
6. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා

යන සාමාජිකයන් පත්කර ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**06ඃ01ඃ05 පුස්තකාල උපදේශන කමිටුව පත්කිරීම**

පුස්තකාල පොත් මිලදී ගැනීමට නිර්දේශ ලබාගැනීම, පාඨක සමාජයේ යෝජනා සම්මත කර ගැනීම, පුස්තකාල සංවර්ධන කටයුතු සාකච්ඡා කර යෝජනා මුදල් කමිටුවට /ගරු සභාවට ඉදිරිපත් කිරීම,ගාස්තු අඩු හෝ වැඩි කිරීම සාකච්ඡා කර කමිටු රැස්වීමේදී අනුමත කර ගැනීම, සඟරා නිකුත් කිරීමේ දී ලිපි ලබාගැනීම සහ සංස්කරණ කටයුතු සඳහා සහභාගි කර ගැනීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා,
**ගරු නාගරික මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන්ගේ නියෝජනය**

1. ගරු නාගරික මන්ත්‍රිනී, එම්. ජී. ශාන්තිලේඛා මැතිතුමිය.
2. ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය.
3. ගරු නාගරික මන්ත්‍රිනී, එම්. සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය.
4. ගරු නාගරික මන්ත්‍රිනී, පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය.
5. ගරු නාගරික මන්ත්‍රී, ඩබ්. ඒ. නදීශාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා.
6. ගරු නාගරික මන්ත්‍රී, කේ. ජී. ප්‍රේමදාස මැතිතුමා.
7. ගරු නාගරික මන්ත්‍රී, එම්. ඩබ්. විමලසිරි මැතිතුමා.
8. ගරු නාගරික මන්ත්‍රී, ලාල් ගලප්පත්ති මැතිතුමා.
9. ගරු නාගරික මන්ත්‍රී, එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා.

10. ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා
11. ගරු නාගරික මන්ත්‍රි එම්. ජේ. මලීක්ෂා මැතිතුමා

**ප්‍රජා නියෝජනය**

12. ටී. එම්. නෙයිසූර් මිය
13. ධර්මසේන සමරසිංහ මයා
14. එච්. ඒ. බී. අයි. සිරිවර්ධන මයා
15. එම්. ජී. එස්. ඩී. නාවනැල්ල මයා
16. ඉන්ද්‍රානි වීරසේකර මිය
17. අනිල් අල්විස් මයා
18. එම්. ජෙයරාජන් මයා
19. කුසුමා අබේසිංහ මිය
20. ඒ. එල්. අක්බර් අලී මයා
21. ඉන්ද්‍රානි එස්. රත්නායක මිය
22. දයානන්ද බෙනරගම මයා

යන සාමාජිකයන් විසි දෙනෙකුගෙන් සමන්විත පුස්තකාල උපදේශන කමිටුව පත්කිරීම

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙම කමිටුව සඳහා ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා සුදුසු බවටත්, පුස්තකාල උපදේශන කමිටුවෙහි සභාපති වශයෙන් ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා සුදුසු බවටත් ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේම කුමාර මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය, ගරු නාගරික මන්ත්‍රි එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රි එම්. ජේ. මලීක්ෂා මැතිතුමා පුස්තකාල උපදේශන කමිටුවෙන් ඉල්ලා අස්වන බව පවසන ලදී.

ඒ අනුව ඉහත සඳහන් බලතල ක්‍රියාත්මක කිරීම උදෙසා 2020 වර්ෂයේ පුස්තකාල උපදේශන කමිටුව වශයෙන්,

1. ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා,
2. ගරු නාගරික මන්ත්‍රිනී, එම්. ජී. ශාන්තිලේඛා මැතිතුමිය.

3. ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය.
4. ගරු නාගරික මන්ත්‍රිනී, එම්. සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය.
5. ගරු නාගරික මන්ත්‍රි, ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා.
6. ගරු නාගරික මන්ත්‍රි, කේ. ජී. ප්‍රේමදාස මැතිතුමා.
7. ගරු නාගරික මන්ත්‍රි, එම්. ඩබ්. විමලසිරි මැතිතුමා.
8. ගරු නාගරික මන්ත්‍රි, ලාල් ගලප්පත්ති මැතිතුමා.
9. ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා
10. ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා
11. ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා

යන සාමාජිකයන් පත්කර ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා ගෙන ආ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05ඃ01ඃ06 සංවර්ධන උපදේශන කමිටුව පත්කිරීම**

බළන්ගොඩ නගර සභා සීමාව තුළ පවතින සියලු සංවර්ධන කටයුතු සඳහා සහ ගරු සභාවේ උන්නතිය, ආදායම් ඒකරාශි කිරීම/ආදායම් මාර්ග වැඩිදියුණු කිරීම ආදී සියලු සේවාවන් සඳහා උපදේශනය ලබාදීම, ගරු සභාව විසින් කලින් කලට පනවනු ලබන අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීම යන කරුණු උදෙසා,

**ගරු නාගරික මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන්ගේ නියෝජනය**

1. ගරු සභාපති, චමික ජයමිණි විමලසේන මැතිතුමා.
2. ගරු උප සභාපති, එම්. ටී. එම්. රුමී මැතිතුමා.
3. ගරු නාගරික මන්ත්‍රිනී, එම්. ජී. ශාන්තිලේඛා මැතිතුමිය.
4. ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය.
5. ගරු නාගරික මන්ත්‍රිනී, එම්. සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය.
6. ගරු නාගරික මන්ත්‍රිනී, පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය.
7. ගරු නාගරික මන්ත්‍රි, ඩබ්. ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා.
8. ගරු නාගරික මන්ත්‍රි, ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා.
9. ගරු නාගරික මන්ත්‍රි, කේ. ජී. ප්‍රේමදාස මැතිතුමා.
10. ගරු නාගරික මන්ත්‍රි, ඊ. ඒ. ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා.
11. ගරු නාගරික මන්ත්‍රි, එම්. ඩබ්. විමලසිරි මැතිතුමා.
12. ගරු නාගරික මන්ත්‍රි, ලාල් ගලප්පත්ති මැතිතුමා.
13. ගරු නාගරික මන්ත්‍රි, ඩබ්. එම්. නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා.
14. ගරු නාගරික මන්ත්‍රි, එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා.

15. ගරු නාගරික මන්ත්‍රි, එම්. නිමල් කරුණාරත්න මැතිතුමා.
16. ගරු නාගරික මන්ත්‍රි, එම්. ජේ. මලීක්‍ෂා මැතිතුමා.
17. ගරු නාගරික මන්ත්‍රි, අකිල සාලිය එල්ලාවල මැතිතුමා.

**ප්‍රජා නියෝජනය**

18. ගරු පූජ්‍ය මෛත්‍රීමූර්ති ස්වාමීන් වහන්සේ
19. ගරු පූජ්‍ය පියනන්ද ස්වාමීන් වහන්සේ
20. ගරු පූජ්‍ය කඳන්ගොඩ සද්ධානන්ද ස්වාමීන් වහන්සේ
21. මුස්ලම් ප්‍රධාන පල්ලියේ පූජකතුමා
22. බළන්ගොඩ නගර සභාවේ හිටපු ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මහතා
23. විශ්‍රාමික විදුහල්පති එම්. ජෙයරාජන් මහතා
24. ආර්. කේ. ඩී. ජයසිංහ මහතා
25. ෆාරුෆ් හාජියාර් මහතා
26. බී. එම්. ගුණතිලක මහතා
27. විල්ෆ්‍රඩ් සිසිල් මහතා
28. හර්ෂන හෙට්ටිආරච්චි මහතා
29. ග්‍රාම නිලධාරිනි චන්ද්‍රා පැලවත්ත මහත්මිය
30. නිහාල් ෆොන්සේකා මයා
31. නිල්මිණි වනසේකර මිය
32. ඉන්ද්‍රානි රත්නායක මහත්මිය
33. මාග්‍රට් පෙරේරා මිය

යන සාමාජිකයන්ගෙන් සමන්විත සංවර්ධන උපදේශන කමිටුව පත් කිරීම

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**06෴01෴07 කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුව**

රුපියල් 250,000.00 දක්වා කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුව ලෙස,

1. ගරු සභාපති, චමික ජයමිණි විමලසේන මැතිතුමා
1. ගරු ලේකම්, එස්.එච්.ඒ.කරුණාත්න
2. ගණකාධිකාරී, එම්. ඩී. එස්. ප්‍රනාන්දු මයා

3. ප්‍රධාන කළමනාකරණ සහකාර, ජී. ඩී. ඒ. සෝමපාල මිය
4. වැඩ අධිකාරී, එස්. එම්. සී. එස්. අබේසිරිවර්ධන මයා
5. පුස්තකාලාධිපති, එම්. මල්කාන්ති උඩවත්ත මිය
6. මහජන සෞඛ්‍ය පරීක්ෂක, කේ. එල්. බී. එල්. කුමාරසිංහ මයා
7. පෙර පාසල් පාලිකා, ටී. පී. එල්. බී. පෙරේරා මිය
8. ආයුර්වේද වෛද්‍ය නිලධාරිනි ඩබ්. ඩබ්. සධානා සංජීවනී පුෂ්පකුමාරි මිය

යන සාමාජිකයින්ගෙන් යුත් කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටු පත් කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:01:08 2020 වර්ෂයට අදාළව සභාව පවත්වන දිනය තීරණය කිරීම.**

2020 වර්ෂයට අදාළව සභාව පවත්වන දිනය තීරණය කිරීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව 2020 වර්ෂයේ සෑම මසකම දෙවන අඟහරුවාදා දින සභාව පැවැත්වීම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේම කුමාර මැතිතුමා විසින් ගෙන ආ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.
අනතුරුව අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමා අයවැය දෙවන වර පරාජයට පත් කිරීමෙන් පසුව සභාව ඉදිරියට කරගෙන යා නොහැකි බවද එබැවින් එය ලේකම්තුමිය විසින් කොමසාරිස්තුමාට දැන්විය යුතු බව ද පැවසූ අතර, මෙයින් ඉදිරියට න්‍යාය පත්‍රයේ කිසිම දෙයක් අනුමත නොකරන අතර ගරු සභාපතිතුමා කොමසාරිස්තුමා සමඟ සභාවේ ඉදිරි කාර්යයන්ට අවශය දෑ අනුමත කළ යුතු නමුත් මින් ඉදිරියට සභාවේ සියළු ගෙවීම් පූර්ව අනුමැතියට යටත්ව සිදුකිරීමට අනුමත කරන බවද පවසන ලදී.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා විසින් යෝජනාවක් ඉදිරිපත් කරමින් සෞඛ්‍ය අංශයේ සියළුම ගෙවීම් සහ අනෙකුත් සේවක පඩිනඩි, අතිකාල දීමනා ඇතුළු දීමනා ගෙවීමටත්, 56-1906 දරණ කෲ කැබ් රථය, ND-5124 දරණ වෑන් රථය හා PF-4006 දරණ ගරු සභාපතිතුමාගේ නිල රථය යන වාහන

තුන සඳහා ලීටර් 600 ක උපරිමයකට යටත්ව ඉන්ධන ලබා දීමටත් ඉතිරි යෝජනා සියල්ල ප්‍රතික්ෂේප කිරීමටත් ගෙන ආ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එමෙන්ම එම යෝජනාව සඳහා බෙදීමක් අවශ්‍ය බවට ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා ගෙන ආ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව එහිදී විවෘත ඡන්දයක් පැවැත් වූ අතර එහිදී යෝජනාවට පක්ෂව සභිකයින් එකොළොස් දෙනෙක්ද, එනම්,

| | | |
|---|---|---|
| 1. | ගරු උප සභාපති | එම්. ටී. එම්. රුමි මැතිතුමා |
| 2. | ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 3. | ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 4. | ගරු නාගරික මන්ත්‍රි | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. | ගරු නාගරික මන්ත්‍රි | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. | ගරු නාගරික මන්ත්‍රි | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 7. | ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 8. | ගරු නාගරික මන්ත්‍රි | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 9. | ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 10. | ගරු නාගරික මන්ත්‍රි | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 11. | ගරු නාගරික මන්ත්‍රි | අකිල එල්ලාවල මැතිතුමා |

මෙහිදී යෝජනාවට විරුද්ධව සභිකයින් හය දෙනෙක්ද, එනම්,

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. | ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 3. | ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 4. | ගරු නාගරික මන්ත්‍රි | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 5. | ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 6. | ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |

ඡන්දය ලබා දෙන ලදී. ඒ අනුව සෞඛ්‍ය අංශයේ සියළුම ගෙවීම් සහ අනෙකුත් සේවක පඩිනඩි, අතිකාල දීමනා ඇතුළු දීමනා ගෙවීමටත්, 56-1906 දරණ කෘෂ කැබ් රථය, ND-5124 දරණ වෑන් රථය හා PF-4006 දරණ ගරු සභාපතිතුමාගේ නිල රථය යන වාහන තුන සඳහා ලීටර් 600 ක උපරිමයකට යටත්ව ඉන්ධන ලබා දීමටත් ඉතිරි යෝජනා සියල්ල ප්‍රතික්ෂේප කිරීමටත් ගෙන ආ යෝජනාව වැඩි ඡන්ද පහකින් (05 කින්) සම්මත විය.

## 08. හදිසි යෝජනා

### 08:01 බැම්මක් සඳහා ආධාර ලබා ගැනීම සඳහා

අංක 41 දොරවෙල, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි එම්. සුනිල් මහතාගේ නිවස පිටුපසින් නායයාමක් සිදු වී ඇති බැවින් අඩි 10 ක් දිග හා පළලින් යුතු එම බැම්ම බැඳීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය උපකාරයක් හෝ මුදල් උපකාරයක් සිදුකරන ලෙස එතුමා විසින් සිදු කළ ඉල්ලීම අනුව අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර අවශ්‍ය සහනය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

### 08:02 නායයාමක් මඟින් නිවසට සිදු වූ හානිය සම්බන්ධවයි.

අංක 17/12, කුමාරගම, බළන්ගොඩ ලිපිනයෙහි පදංචි එස්.එම්.රිෆාන් මහතා විසින් ඔහුගේ නිවස පිටුපස තිබූ පස් කණ්ඩිය නාය යාම නිසා නිවසේ මුළුතැන්ගෙය, වැසිකිළිය හා නාන කාමරය ඇතුළුව නිවසේ අඩකට වඩා වැඩි කොටසක් සම්පූර්ණයෙන්ම විනාශ වී ඇති බැවින් එම නිවාස අළුත්වැඩියා කර දීම සඳහා අවශ්‍ය උපකාරයක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බව පවසන ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා අදහස් දක්වමින් මෙම නිවසට විශාල හානියක් සිදුව ඇති බැවින් නගර සභාව මඟින් ලබා දිය හැකි සහනයක් ලබා දිය යුතු බව පවසන ලදී. එබැවින් ඒ සඳහා රු.15,000.00 ක මුදලක් ලබා දීම සුදුසු බවට ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ගෙන ආ යෝජනාව ගරු සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, සභාවේ මූලික කටයුතු වලින් බැහැරව ඉටු කරන පුණ්‍යාධාර ආදිය සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ ලිඛිත අනුමැතිය ලබා ගත යුතු බැවින් එසේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව එම මුදල ලබා දිය හැකි බව පවසන ලදී. ඉහත යෝජනාව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

### 08:03 පොදු වෙළෙඳසැල අංක 17 දරණ කුකුල් මස් කඩ කාමරය සම්බන්ධවයි.

පොදු වෙළෙඳසැල අංක 17 දරණ කුකුල් මස් කඩ කාමරයේ ටෙන්ඩර් ගාස්තුව වැඩි බැවින් එහි ගාස්තුව රු.12,000.00 දක්වා අඩු කර ලබා දෙන මෙන් එම්.එන්.එම්.රිස්මි මහතා ඉදිරිපත් කර ඇති ලිපිය ප්‍රකාරව ඔහුට ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා ගෙන ආ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රාඩී.වීරසිංහ මැතිතුමිය

විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පවසා සිටියේ පොදු වෙළෙඳසැල කුකුල් මස් කඩ කාමරය පළමුවර ටෙන්ඩර් කළද එහිදී කිසිදු ලංසුපතක් නිකුත් නොවූ බැවින් 25%ක මුදලක් අඩුකර අද දින දෙවන වර ටෙන්ඩර් කර ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබුව ද එහිදී ද කිසිදු අයදුම්පතක් නිකුත් නොවූ නිසා එම්.එන්.එම්.රිස්මි මහතා රු.12,000.00 දක්වා මුදල අඩු කර ලබා දෙන්නේ නම් එම කඩ කාමරය ලබා ගන්නා බවට ලිඛිතව ඉල්ලීමක් සිදුකර ඇති බව පවසන ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ සභාව මඟින් කුකුල් මස් අධි ශීතකරණ තුල තබා විවෘත ස්ථානවල පවත්වාගෙන යාම නවතාලන්නේ නම් ඉහත නම සඳහන් පුද්ගලයා රුපියල් ලක්ෂයකට වුවද මෙම කඩ කාමරය ලබා ගැනීමට කැමැත්තෙන් සිටින බවයි. එමෙන්ම කුකුල් මස් කඩ කාමර විවෘත අධි ශීතකරණ තුළ තබා විකිණීම තුළින් සභාව සඳහා විශාල ආදායමක් නොලැබෙන අතර බලපත්‍ර ගාස්තු වශයෙන් ලැබෙන රු.3,000.00 ක මුදල පමණක් ආදායම වශයෙන් සභාවට ලැබෙන බැවින් සභාවට ලැබිය යුතු ආදායම නොලැබෙන බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී මැතිතුමා අදහස් දක්වමින් මෙම කඩ මඟින් පිටකරන අප ජලය කාණු තුළට බැහැර කරන බැවින් නගරය ගඳ ගසන බව ද මේ සම්බන්ධ පවතින සම්මත අතුරු ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීම සුදුසු බව ද පවසන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙම ප්‍රශ්නයට ප්‍රධාන හේතුව පොදු වෙළෙඳසැල අක්‍රමවත්ව පැවතීම බවයි. එමෙන්ම මෙම කඩ කාමර තහනම් කරන්නේ නම් සම්මත අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම කඩ තහනම් කිරීම සඳහා අද දින යෝජනාවක් සම්මත කරගත යුතු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් කුකුල් මස් විවෘත අධි ශීතකරණ තුළ දමා විකිණීම තුලින් විශාල පිරිසක් තම ආදායම සරිකරගන්නා අතර එම ස්ථානයන්හි කුකුල් මස් සාධාරණ මිලකට විකුණන බැවින් හා අහිංසක මිනිසුන් එදිනෙදා ආහාරයට මස් රැගෙන යන බැවින් එම කාඩ කාමර නතර කිරීමට තම විරෝධතාවය ප්‍රකාශ කරන ලදී. එමෙන්ම අවශ්‍ය නම් එහි පැවතිය යුතු නීති රීති වෙනස් කරන ලෙසත්, පොදු වෙළෙඳසැල කුකුල් මස් කඩ කාමරය ඉහත නම සඳහන් පුද්ගලයා ඉල්ලුම් කරන මිලට ලබා දෙන ලෙසත් පවසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පොදු වෙළෙඳසැල අංක 17 දරණ කුකුල් මස් කඩ කාමරය ටෙන්ඩර් කිරීමට අදාළ පුවත්පත් දැන්වීම් පළ කිරීම සඳහා ද විශාල වශයෙන් මුදල් වැය වී ඇති බැවින් මෙම පුද්ගලයාට රු.12,000.00 මුදල සඳහා වැට් බදු අයකර ලබා දීම සුදුසු බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විරෝධතා නොමැති හෙයින් පොදු වෙළෙඳසැල අංක 17 දරණ කුකුල් මස් කඩ කාමරය එම්.එන්.එම්.රිස්මි මහතාට රු.12,000.00 මුදල හා ඊට අදාළ රජය විසින් පනවනු ලබන බදු අය කර ලබා දීමට ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**09. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

මෙහිදී 2019.10.22 දින හා 2019.11.14 දින පැවති මුදල් කමිටු වාර්තා ගරු සභාපතිතුමන් විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

**10. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | **8,618,365.14** |
| වෙනත් ලැබීම් | **1,942,543.58** |
| මුලු ලැබීම් | **10,560,908.72** |
| පුනරාවර්තන වියදම් | **9,376,411.68** |
| වෙනත් වියදම් | **2,441,386.19** |
| මුලු වියදම් | **11,817,797.87** |

**2019-12-01 සිට 2019-12-31 දින දක්වා ඉන්ධන වාර්තාව**

| **වාහන අංකය** | **මුළු එකතුව** |
|---|---|
| 226-7521 | 12,480.00 |
| 227-5020 | 47,356.00 |
| | 1,590.00 |
| RD - 8240 | 30,160.00 |
| ZA -0228 | 5,200.00 |
| 56-1906 | 19,760.00 |
| BC-0005 | 49,920.00 |
| GC 0001 | 14,868.00 |
| | 330.00 |

| | |
|---|---|
| LL - 7688 | 4,160.00 |
| HF - 8558 | 17,435.00 |
| | 538.00 |
| GK-1483 | 8,134.00 |
| GK-6227 | 13,018.00 |
| JD-4684 | 1,370.00 |
| LL-2110 | 14,017.00 |
| ND-5124 | 17,264.00 |
| DPP-0006 | 1,370.00 |
| OS0006 | 700.00 |
| PF-4006 | 30,212.16 |
| QL-2901 | 5,480.00 |
| RC-1107 | 12,235.00 |
| RC-1118 | 15,600.00 |
| RC-8183 | 24,440.00 |
| RE-2600 | 24,440.00 |
| UQ - 1933 | 4,110.00 |
| RD -8000 | 3,670.00 |
| VI - 1833 | 1,096.00 |
| HF-7899 | 33,555.00 |
| | 1,015.00 |
| WB-0003 | 935.00 |
| | 1,000.00 |
| SDRR 0013 | 13,090.00 |
| YG-0758 | 2,055.00 |
| MG 0014 | 4,160.00 |
| ZA - 5039 | 31,130.00 |
| | 3,220.00 |
| | 12,705.00 |
| එකතුව | **467,893.16** |

**මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

## 11. පෞද්ගලික මන්ත්‍රි පැහැදිලි කිරීම්

**ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් මෑතක දී බඳවා ගන්නා ලද වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් අට දෙනා වෙනුවෙන් සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වූයේ කොහේද? එම සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳෙව්වේ කවුද? මොවුන් සඳහා වැටුප් ගෙවන්නේ කොහෙන්ද? යන්නත් උඩකන්ද මාර්ගය සඳහා ස්ලැබ් යෙදීම සාර්ථකව නිම කර ඇත් ද? යන්නත් විමසා සිටි අතර මෙය සාර්ථකව නිම කර නොමැති වීම හේතුවෙන් ඒ සඳහා වන මුදල් ගෙවීම සිදු කිරීමට තමා විරුද්ධ බව පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් පොලීසිය ඉදිරිපිට බස් නැවතුම්පල ආසන්නයේ කොන්ක්‍රීට් ස්ලැබ් දෙකක් අනෙක් ස්ලැබ් වලට වඩා අගල් 03 ක් උස බව පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙම කොන්ක්‍රීට් ස්ලැබ් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් ස්ථාපිත කර ඇති අතර එම ව්‍යාපෘතිය අසාර්ථක බව දැනුම් දෙන බවයි.

**ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින් අද දින 2020 වර්ෂයේ අයවැය පරාජයට පත් කලේ ගරු සභාපතිතුමා විසින් තම පක්ෂයට සිදු කළ අසාධාරණකම් නිසා මිස ගරු සභාපතිතුමා සමඟ පවතින පෞද්ගලික ප්‍රශ්නයක් නිසා නොවන බව පවසන ලදී.

එමෙන්ම ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති නොවූනේ නම් තම පක්ෂය විසින් මෙම තීන්දුව නොගන්නා අතර අයවැය පරාජය කළේ කිසිවෙකුට හානියක් සිදු කිරීමට නොවන බව පැවසූ අතර බළන්ගොඩ නගර සභාවේ සෞඛ්‍ය අංශය බරපතල ලෙස කඩා වැටීමකට ලක්ව ඇති නිසා සෞඛ්‍ය අංශයේ ඕනෑම කටයුත්තක් අනුමත කරන බව ද බළන්ගොඩ නගරයේ ඩෙංගු රෝගය විශාල වශයෙන් ව්‍යාප්ත වී ඇති බව ද පවසන ලදී.

කර්මාන්ත ඉටු කිරීමේදී තම පක්ෂයට අසාධාරණයක් සිදු වූ අතර මෙම සභාව තම පක්ෂය වන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විසින් ජයග්‍රහණය කළ සභාවක් වන බව පැවසූ ගරු මන්ත්‍රීතුමා

මෙම සභාවේ ගරු සභාපතිතුමා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයෙකු වන නමුත් මේ වන විට ජනාධිපති, අගමැති හෝ ආණ්ඩුකාරතුමා ද එම පක්ෂයේ නොමැති බැවින් සභාව සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගන්නේ කෙසේද? ජනතාවට සේවය කරන්නේ කෙසේද? යන්න විමසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රීතුමා මෙම සභාව මගින් තම පක්ෂයට සාධාරණයක් ඉටු නොවුණු බව ද ගරු සභාපතිතුමා විසින් විපක්ෂයට අවශ්‍ය දේ නොකරන බව පවසා ඇති බව ද පැවසීය. අද දින සභාවේදී 2020 වර්ෂය සඳහා පත්වූ කමිටුවල බලය පොදු ජන පෙරමුණ ලබා ගත් අතර අද දින සිට මෙම වර්ෂය අවසන් වීම සඳහා පවතින ඉදිරි දින 21 ක කාලය තුල ජනතාවට අගතියක් නොවන ආකාරයට තමා කළ යුත්තේ කුමක් දැයි යන්න තේරුම්ගැනීම සඳහා ගරු සභාපතිතුමාට බුද්ධිය පහළ වේවායි පතමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා</u>**

ගරු නාගරිත මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා අදහස් දක්වමින් තමන් අයවැයට විරුද්ධවීම ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණට සහය දීමක් නොවන අතර අද දින ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සභාපතිවරයෙක් මෙම අයවැය ඉදිරිපත් කරනු ලැබුවේ නම් එයට ද විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන බව ද එය ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රතිපත්තිමය තීන්දුවක් බව ද පවසන ලදී. එමෙන්ම චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය ජනාධිපතිව සිටින සමයේ ජනතා විමුක්ති පෙරමුණේ ඇමතිවරුන් හතර දෙනෙකු පාර්ලිමේන්තුව නියෝජනය කළ නමුත් එකල ද අයවැයට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කල බව පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා අදහස් දක්වමින් තමන්ගේ හෘද සාක්ෂියට අනුව තමන් කිසි දිනක මෙවැනි ක්‍රියාවක් නොකරන නමුත් අද දින මෙම සභාවේ අයවැය පැරදවීම පක්ෂයක් ලෙස ගත් තීරණයක් බව ද, රත්නපුර දිස්ත්‍රික්කයේ පලාත් පාලන ආයතන 21 අතුරින්ම එක්සත් ජාතික පක්ෂයේ සභාපතිවරයෙක් සිටින එකම සභාව මෙම සභාව වන අතර ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ජයග්‍රහණය කර තිබියදීත් ජනාධිපති හා අගමැති සිටියදීත් මෙවර අයවැය පරාජය නොකලේනම් ඒ සම්බන්ධව තම පක්ෂයෙන් චෝදනාවක් පැමිණෙන බව ද පවසන ලදී.

එමෙන්ම මෙය පක්ෂයේ තීන්දුවක් බැවින් පෞද්ගලිකව අමනාප නොවන ලෙසත්, දේශපාලනය කරන සියළු දෙනා වීදුරු ගෙවල් වල ජීවත් වන මිනිස්සු බවත්, තමන් මෙය හෘද සාක්ෂියට එකඟව සිදු කළ දෙයක් නොව පක්ෂ නායකයෙක් ලෙස ගත් තීන්දුවක් බවත් පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වමින් ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වශයෙන් සිට ජනතාවගේ ආරාධනාව මත පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් පත්වී නැවත දින 51 ආණ්ඩුවේ අගමැති වශයෙන් ද අනතුරුව ඉන් ඉවත් වී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා යටතේ එතුමා අගමැති වී සිටින බවත් මෙරට 5 වන ජනාධිපතිවරයා වූ එතුමාට එසේ කිරීමට හැකි වූයේ එතුමාගේ පවතින ඉවසීම ගුණය නිසා බව පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**<u>ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා</u>**

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අදහස් දක්වමින් තමන් විසින් තම පක්ෂය වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකතුමා, ලේකම්තුමා හා උප සභාපතිතුමා සමඟ මෙවර අයවැය සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කළ අතර එහිදී පසුගිය කාල වකවානුව තුළ සිදු වූ අඩුපාඩු ඉදිරිපත් කරමින් අයවැයට විරුද්ධ වන ලෙසත්, එසේ නොමැති අයවැයට විරුද්ධව ඡන්දය පාවිච්චි කිරීම දේශපාලන න්‍යාය පත්‍රය තුළ නොමැති බවත් පැවසූ අතර එබැවින් ගරු සභාපතිතුමා තුළින් 2019 වසර තුළදී සිදු වූ අඩුපාඩුකම් ඉදිරිපත් කළ බව පවසන ලදී.

එමෙන්ම ගරු සභාපතිතුමා තමන් මුල් කාලයට වඩා පසු කාලයේදී ඈත් වූ බවට චෝදනා කළ නමුත් එයට හේතුව වන්නේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරුන්ගෙන් තමන්ට සිදු වූ අසාධාරණකම් බවද, චමික යන පුද්ගලයාට තමන් ආදරය බවද ඔහු පිරිසිදු පුද්ගලයෙකු වන නමුත් සභාපතිවරයෙකු ලෙස ඔහුගෙන් සිදු වූ අඩුපාඩු පැවසිය යුතු බව ද පැවසූ ගරු උප සභාපතිතුමා පෞද්ගලික තම පක්ෂයේ සාමාජිකයන් තිදෙනා ගරු සභාපතිතුමා සමඟ අමනාපයක් නොමැති බවද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් 2018 පළාත් පාලන මැතිවරණයේදි ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ ඡන්ද 5000 ක් ලබා ගනිමින් ආසන 7 ක් ද, එක්සත් ජාතික පක්ෂය ඡන්ද 4800 ක් ලබා ගනිමින් ආසන 3 ක් ද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඡන්ද 2500 ක් ලබා ගනිමින් බෝනස් ආසන 3 ක් ද, ජනතා විමුක්ති පෙරමුණ ඡන්ද 562 ක් ලබා ගනිමින් එක් ආසනයක් ද වශයෙන් ලබා ගනිමින් බළන්ගොඩ නගර සභාවේ සභාව පිහිට වූ අතර මෙම සභාවේ බහුතරය ශ්‍රී ලංකා එක්සත් ජාතික පක්ෂය හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එකතු වී පිහිටුවා ගනු ලැබූ බව සඳහන් කල ගරු නාගරික මන්ත්‍රීතුමා හිටපු ජනාධිපතිතුමාගේ හා අගමැතිතුමාගේ විරසක වීම මත මෙම සභාවේ තත්ත්වය වෙනස් වූ බව ද පවසන ලදී.

එසේ සභාව පිහිට වූ අවස්ථාවේදී ගරු උප සභාපතිතුමාට එම තනතුර ලැබුණු අතර එහිදී එතුමා විසින් ඉතාමත් සද්භාවයෙන් එක්සත් ජාතික පක්ෂය සමඟ කටයුතු සිදු කළ නමුත් සිදුවූ

දේශපාලන පෙරළිය සමග අද දින මෙම තත්වය උදා වී ඇති බවත් බලයට ඇති කෑදරකම නිසා මෙසේ වෙනස් ව ඇති බවත් පැවසූ ගරු මන්ත්‍රීතුමා, ගරු උප සභාපතිතුමා විසින් ගරු සභාපතිතුමාට විරුද්ධව අද දින කථා කළ නමුත් මුල් කාලයේදී ගරු උප සභාපතිතුමා, ගරු සභාපතිතුමා සමග ඉතාමත් සහයෝගයෙන් හා කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කළ බව ද ජනාධිපතිවරණයෙන් සජිත් ප්‍රේමදාස මැතිතුමා ජයග්‍රහණය කළේ නම් අද මෙම තත්ත්වය වෙනස් වී පොදුජන පෙරමුණට එක් නොවන බව ද පවසන ලදී.

එසේම ගරු උප සභාපතිතුමා ගරු සභාපතිතුමාගේ ළඟින් ඉඳ විරුද්ධකම් කළ බැවින් මිනිසුන් කවුරුන්දැයි හඳුනාගනිමින් ඉදිරියට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන බව පවසන ලදී.

එමෙන්ම මෙම අවස්ථාවේදී සභිකයන් ඉදිරිපත් කළේ පක්ෂයේ මතය නොව තම පෞද්ගලික මතය බව ද තමන් මෙම සභාව සඳහා පත්වූයේ බළන්ගොඩ ජනතාවට සේවය කිරීමට බැවින් කුමන සභාපතිවරයා යටතේ හෝ එම සේවය සිදු කරන බව ද පැවසූ ගරු මන්ත්‍රීතුමා තමන් ප්‍රතිපත්ති ගරුක පක්ෂයක් වන එක්සත් ජාතික පක්ෂයේ දිගටම රැඳී සිටින බවද පවසන ලදී.

එමෙන්ම 2018 වර්ෂයේ තමාට රු.300,000.00 මුදල නොලැබුණු අතර එම මුදල ලබා දෙන ලෙසත් 2019 වර්ෂයේ සංවර්ධන යෝජනා වශයෙන් වතුකාරගොඩ බේබි ආච්චිගේ නිවසට යන අඩිපාරෙහි පැති බැම්මක් ඉදිකර සංවර්ධනය කිරීම, ගුණපාල මහතාගේ නිවසට යන මාර්ගය සංවර්ධනය කිරීම, මිරිස්කොටුව ජයතිලක මහතාගේ නිවසට යන අඩි පාර සංවර්ධනය කිරීම යන යෝජනා ඉටු කර දෙන ලෙසත්, පොල්ලමුරේ රාළහාමිගේ නිවස අසළ අනතුරුදායක කොස් ගස කපා ඉවත් කිරීම පිළිබඳ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින ලදී. එමෙන්ම රාජකරුණා මහතාගේ නිවසට යන පාරෙහි සංවර්ධනය නොකළ ඉතිරි කොටස සංවර්ධනය කර දෙන ලෙසත් සංවර්ධනය කළ කොටසෙහි නායයාමක් සිදුවී ඇති නිසා මාර්ගය කැඩී ඇති අතර එම කොටසද සංවර්ධනය කර දෙන ලෙසත් ඉල්ලා සිටිමින් 2020 වර්ෂය සාර්ථක ජයග්‍රාහි වසරක් වේවා යි සුභ පතමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**<u>ගරු උප සභාපති එම්.ටී.එම් රූමි මැතිතුමා</u>**

මෙහිදී අදහස් දක්වන ලද ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින් ගරු සභාපතිතුමා හට විරුද්ධ කම් සිදු කළේ කවුද යන්න තමා දන්නා අතර තමන් කෙළින් කථා කරන මිනිසෙකු මිස දෙපිට කාට්ටුවෙකු හෝ අවස්ථාවාදී කුහක ගති ඇති අයෙකු නොවන බැවින් තමන් පිළිබඳ ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් සිදු කළ ප්‍රකාශය ඉල්ලා අස්කර ගන්නා ලෙස පවසන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේම කුමාර මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේම කුමාර මැතිතුමා අදහස් දක්වමින් ගරු සභාපතිතුමා 2019 වර්ෂයේදී ලක්ෂ 38 ක සංවර්ධන කටයුතු සිදු කර ඇති අතර ඉන් රුපියල් ලක්ෂ 18 ක සංවර්ධන කටයුතු කිරිඳිගල කොට්ඨාශය සඳහා සිදු කර ඇති බැවින් ඒ සඳහා ස්තූතිය පළ කරන නමුත් කොට්ඨාශයේ මන්ත්‍රීවරයා ලෙස තමන් කිසිඳු දැනුවත් වීමක් සිදු නොවීම පිළිබඳ කණගාටුව ප්‍රකාශ කරන ලදී. එමෙන්ම 2020 වර්ෂයේ අයවැයට විරුද්ධ වූයේ තම පක්ෂයෙන් ගත් තීන්දුවක් නිසා බවත් ගරු සභාපතිතුමා සමඟ පුද්ගලික අමනාපයක් නොමැති අතර ගරු සභාපතිතුමා හොරෙක් දූෂකයෙක් නොවන පිරිසිදු පුද්ගලයෙක් බවත් වෙනත් කවුරු හෝ පුද්ගලයෙකු සභාපති වශයෙන් පත්වන්නේ නම් මෙවන් පිරිසුදු පුද්ගලයෙකු පත් කර ගන්නා ලෙසත් ඉල්ලා සිටින ලදී.

එමෙන්ම සමහරු විසින් ජනාධිපතිතුමාගේ ජයග්‍රහණය පාස්කු ඉරු දින ප්‍රහාරය නිසා ලැබූ ජයක් බව පවසමින් අව තක්සේරුවට ලක් කළද පළාත් පාලන මැතිවරණය පැවැත්වූයේ පාස්කු ප්‍රහාරයට පෙර වන අතර එයින් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විශාල ජයක් ලැබූ බවද එක්සත් ජාතික පක්ෂය සිදුකල ආර්ථික සාමාජිය හා ආගමික වැඩ පිළිවෙල ජනතාව හෙලා දුටු බැවින් ජනාධිපතිතුමාට මෙම ජය ලැබූ බවත් පැවසූ අතර ලබන්නා වූ 2020 නව වසර සුභ වාසනාවන්ත නව වසරක් වේවායි පතමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් අද දින ගරු සභාපතිතුමා අයවැය පරාජය කිරීම මත අපහසුතාවයට පත්වූ අතර තමා හා ගරු සභාපතිතුමා පාසල් යන කාලයේ සිටම මිතුරෝ වන බැවින් ගරු සභාපතිතුමා සභාපති ලෙස පත්වූ දින ඒ පිළිබඳව තමා සතුටු වූ බවත් අද දින අයවැයට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළේ ගරු සභාපතිතුමා සමඟ පවතින පෞද්ගලික අමනාපයක් නිසා නොවන බවත් පවසන ලදී.

එමෙන්ම බුලත්තම කොට්ඨාශයේ මන්ත්‍රීවරයා ලෙස තමන්ටත්, බුලත්ගම ජනතාවටත් සිදු වූ අසාධාරණය නිසා මෙම තීන්දුව ගත් බවද එබැවින් තම මිතුදම පලුදු නොවන බවද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය</u>**

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රාඩී.වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් බළන්ගොඩ බස්නැවතුම්පල කොතරම් පිරිසිදු කළද නැවත වරක් පෙර පරිදිම බුලත් කෙළ ගසා විනාශ කර ඇති අතර මේ පිළිබඳව සොයා බලා කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

එමෙන්ම පසු ගිය කාල වකවානුවේ සිට ප්‍රශ්නයක්ව පැන නැගි තුඹගොඩ විහාරස්ථානයේ කාණු පද්ධතිය පිළිබඳ ගැටලුව 2019 වර්ෂයේ සංවර්ධන යෝජනා ලෙස තමන් ඉදිරිපත් කර ඇති බවත්, තමන් කරව්කැටිය කොට්ඨාශයෙන් ඡන්දය ඉල්ලූ නමුත් මෙම ව්‍යාපෘතිය බුලත්ගම කොට්ඨාශයේ ව්‍යාපෘතියක් බවත් පැවසීය. බළන්ගොඩ නගරයේ මෙන්ම ලංකාවේ ඕනෑම ස්ථානයක වුවද සේවය කිරීමට තමා කැමැත්තෙන් සිටින අතර සේවය කිරීමේ දී තමන්ට පක්ෂයක් පාටක් නොමැති බවද තමා මෙම කාර්යය ඉටු කරනුයේ සද්භාවයෙන් බැවින් මෙම කාර්යය ඉටු කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටි අතර, ලබන්නා වූ 2020 නව වසරෙහි සියලු දෙනාටම සතුටින් සමගියෙන් කටයුතු කිරීමට ශක්තිය ධෛර්ය ලැබේවායි පතමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ. මලීක්ෂා මැතිතුමා</u>**

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ. මලීක්ෂා මැතිතුමා බළන්ගොඩ ෆලීල් හාජ්ජියාර් මාවත ජල ටැංකිය පාර උඩ කොටස අලුත්වැඩියා කර දෙන ලෙසත්, සුබයිර් ආලීම් මාර්ගයෙන් ගලා බසින ජලය පුද්ගලික ඉඩමක් තුළින් ගලා යන බැවින් එය වැළැක්වීම සඳහා කාණුවක් යොදා පිළියම් යොදන ලෙසත් ඉල්ලා සිටින ලදී.

ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රි ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රි ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රි ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රි එම්. නිමල් කරුණාරත්න මැතිතුමා ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය, ගරු නාගරික මන්ත්‍රි එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා ගරු නාගරික මන්ත්‍රි එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා ගරු නාගරික මන්ත්‍රිනි පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය ගරු නාගරික මන්ත්‍රිනි, එම්. ශාන්තිලේඛා මැතිතුමිය, ගරු නාගරික මන්ත්‍රි කේ. ජී. පේමදාස මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රි අකිල එල්ලාවල මැතිතුමා ප.ව.3.30 ට පමණ සභාවෙන් පිටව යන ලදී.

**11. අවසානය**

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ අද දින කුමන ආකාරයේ වැරදි අඩුපාඩු පැවසුව ද සභාව අවසන් වීමට පෙර මන්ත්‍රීවරුන් සභාවෙන් පිටවී යාම නිසා කිසිවක් පැහැදිලි කර දීමට අවස්ථාවක් නොලැබුණු අතර එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් වන මලීක්ෂා මැතිතුමා, විමලසිරි මැතිතුමා හා සුනේත්‍රා මන්ත්‍රීතුමිය පමණක් සභාවේ රැඳී සිටියදී ඉතිරි මන්ත්‍රීවරුන් සභාවෙන් පිටව ගිය බැවින් තමාට නගපු චෝදනා ප්‍රශ්න වලට කිසිඳු පැහැදිලි කිරීමක් සිදු කිරීමට හැකියාවක් නොමැති බවයි.

එමෙන්ම වසර ගණනාවකට පසුව බළන්ගොඩ නගරයේ අලුත් කණ්ඩායමක් විසින් නගරය පිරිසිදු කිරීම් කටයුතු සිදු කිරීමට ආරම්භ කර තිබෙන අතර දීර්ඝ කාලීනව බස්නැවතුම්පල ආරක්ෂාව හා සිදුවන අකටයුතුකම් ආදිය නතර කිරීම හා මැතිවරණයෙන් පසුව නැවත ආරම්භ වී තිබෙන පදික

වෙළෙඳාම නතර කිරීම සඳහා බළන්ගොඩ නගර සභාව වෙත පොලීසිය මගින් අවශ්‍යව තිබූ සහයෝගය නොලැබූ අතර වසර ගණනනාවකට පසු දුටු නව දෙයක් ලෙස ඒ පිළිබඳව අද දින විශාල චෝදනා ප්‍රමාණයක් එල්ල කර බව පවසන ලදී. අදාළ කාර්යයන් සඳහා මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත කමිටු පත්කර ගනිමින් අංශ භාර නිළධාරින් හරහා නගරයේ සියළු කාර්යයන් පවරා තිබුණද එම කාර්යයන් නිසි පරිදි ඉටු නොකර තමන්ව නොමග යවා ඇති බව පවසන ලදී. එනමුත් තමන් දන්නා අයුරින් එම නිළධාරින් විශාල වෙහෙස මහන්සියක් දරා එම ස්ථාන පරීක්ෂා කර සුද්ධ පවිත්‍ර කර අවශ්‍ය කාර්යයන් ඉටුකළ බව වැඩිදුරටත් පවසන ලදී.

අවස්ථාවාදි දේශපාලනය නිසා අද දින සභාවේ සිදුවූ අසම්මුතිය අනුව සභාවේ වැඩ කටුයතු අඩාල වු අතර තමන් මෙම ආයතනයේ අයිතිකරු නොව තාවකාලික භාරකරු පමණක් බවද තමා සභාපතිත්වය දරණ කාලයේ තමාගේ වගකීම තමාට ලැබෙන සහයෝගයත් සමග හැකි අයුරින් හරියාකාරව ඉටු කිරීමට කටයුතු කර ඇති බව පවසන ලදී. එමෙන්ම ඉදිරියේදී නගර සභා ආඥා පනත අනුව නීත්‍යානුකුලව වැඩ කටයුතු සිදු කරන අතර තමන්ට මෙම සභාවේ බලහත්කාරයෙන් රැදී සිටිමට අවශ්‍යතාවයක් නොමැති අතර නීතිය්‍යානුකුලව අවශ්‍ය කටයුතු සිදු කරන බවද පවසූ ගරු සභාපතිතුමා එවිට අප රට තුළ සාධාරණ නීතියක් තිබෙන බවට සඳහනක් ඇති වන බව පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා තමාට මෙම සභාවේ රැදී සිටීමේ අවශ්‍යතාවයක් නොමැති අතර නීත්‍යානුකුලව නගර සභා ආඥා පනත ප්‍රකාරව අවශ්‍ය නීති උපදෙස් ලබා ගනිමින් සභාවේ ඉදිරි කටයුතු කරගෙන යාමට බලාපොරොත්තු වන බව පවසමින් අද දින සභාව සඳහා සහභාගි වූ සියලු දෙනා සඳහා ස්තුතිය පළ කරමින් ප.ව.3.40 ට පමණ සභාවේ වැඩ කටවුතු අවසන් කරන ලදී.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.